සාධු දැක්ම

THE EXCELLENT VIEW

3

(සත්‍යයේ බලය විනිවිද දැකිය හැකි රතන සූත්‍රය අනුසාරයෙනි.)

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

රතන සූත්‍රය
Jewel Discourse

In

පාළි

English

සිංහල - ගද්‍ය, පද්‍ය

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

© අයිතිය සම්පාදක සතුයි.
ISBN 978-955-50082-6-6

ප්‍රථම මුද්‍රණය 2016 - (බුද්ධ වර්ෂ 2560)

සාධු දැක්ම - The Excellent View - 3

(සත්‍යයේ බලය විනිවිද දැකිය හැකි රතන සූත්‍රය අනුසාරයෙනි.)

කර්තෘගේ වෙනත් පොත්

1. මා පිය ගුණ සමර
2. සාධු දැක්ම - The Excellent View
3. දරිද්‍රතාව හඹා යයි.
4. සුවදායක මාවතක් - A Blissful Path
5. ප්‍රීතිමත් ජීවිතයට මග
6. තුදුස් වසරක සඳහන් එළියක් - A Moon Light of 14 years
7. සාධු දැක්ම - 2 The Hymn of Universal Love
   කරණීය මෙත්ත සූත්‍රය

පිදුම

සංසාර භව කතරේ අතරමංව සිටි මා විසින්
රැස්කර ගත්තා වූ පුණ්‍ය බල මහිමයෙන්,
මෙවන් බුද්ධෝත්පාද කාලයක
මිනිස් භවයක් ලැබීම පිණිස
මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට
අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් මහද තුළ ජනිත කරවමින්,
මෙලොව ඉපදීමට
මා ලද භාග්‍ය සුරක්ෂිත කර දී,
ලේ කිරි කර පොවා මා හදා වඩා
ගුණනැණ බෙලෙන් ද පෝෂණය කළ
දයාබර මෑණියන් වූ විශ්‍රාමලත් විදුහල්පතිනි
ලෝරා හෙට්ටිආරච්චි මැතිනියට
සහ පංචශීල ප්‍රතිපත්තීන් දිවිහිමියෙන් සුරකිමින්
ආදර්ශයෙන්ම යායුතු මග පෙන්වා දී,
නිර්භයව එම නිසි මාවත ඔස්සේ
පා නැගීමට හැකි පෞරුෂයක්
මහද තුළ වර්ධනය කරමින්,
උපන් බිමට ණය නැති
මිනිස් රත්නයක් ලෙසින්
සමාජයට ඵලදායි සේවාවක්
සාර්ථකව ඉටු කිරීමට හැකි ස්ථාවරයකට
මා ඔසවා තැබූ
දයාබර පියාණන් වූ විශ්‍රාමලත් විදුහල්පති
විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට
බැතිබර සෙනෙහසින් පිදේ.

To my beloved parents in Everlasting Gratitute

උත්තමාචාරය

Salutation

හැකියාවන් සහ කුසලතාවන් නිසි ලෙස හඳුනාගනිමින් එය
ආධ්‍යාත්මික සංවර්ධනයක් සඳහා යොමු කරවීමට නිසි උපදෙස්
සහ අවවාද ලබා දෙමින් දහම් ඇස පෑදූ කල්‍යාණ මිත්‍ර
අති උතුම් මහා සංඝ රත්නයට,

සාර ධර්ම පරිපෝෂණයක් සමගින් පොත පත දැනුම
ලබා දී දහස් සංඛ්‍යාත සිසු පරපුරක නැණ පහන් දැල්වීමට
හැකි ඵලදායී වෘත්තියකට පිවිසීමට මග පෑදූ
මාගේ දයාබර ගුරු දෙමාපියන්ට,

සහ

මෙම ග්‍රන්ථය අප දයාබර පියාණන් වහන්සේ ගේ
එකොළොස්වන ගුණානුස්මරණ පිංකම
(19-07-2016) යෙදී ඇති වස් ආරාධනා පිංකමේදී,

කුරුණෑගල පුරාණ ගල්ලෙන් විහාරය හෙවත්
ශ්‍රී ශෛලන්තාරාම විහාරයට වසර 100 ක් සපිරෙන
මෙම ඓතිහාසික මොහොතේදී ම,
ශ්‍රී ශෛලන්තාරාමය සහ මාදොළුවාව ශ්‍රී සුධර්මාරාමය
යන උභය විහාරාධිපති

පූජනීය හෝමාගම සිරි ධම්ම නායක ස්වාමීන් වහන්සේගේ
පිංබර සුරතට, බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව
පූජා කිරීමට අවස්ථාව සලසාදුන්
කල්‍යාණ මිත්‍ර සුපින්වතුන්ට

To
Honorable Maha Sanga
Benevolent Teachers and friends

පෙරවදන
FOREWORD

බුද්ධ ශ්‍රාවක, ශ්‍රාවිකා සෑම අයෙකුගේම හැබෑ අරමුණ විය යුත්තේ සිව්සස් දහම් අවබෝධයෙන් ලබන්නා වූ නිවනයි. මේ සඳහා වර්තමානයේ අප සියලු දෙනාටම ඇති එකම මඟ නම් නිර්මල බුද්ධ දේශනාවයි. ඒ අතරින් උතුම් වූ රතන සූත්‍ර දේශනාව ද සෙත් ප්‍රාර්ථනාවක් මෙන්ම නිවන් මඟට උපකාර වන ධර්ම පරියායකි. මේ බව පැහැදිලි වන්නේ රතන සූත්‍ර දේශනාවට නිදාන වූ හේතුව සොයා බැලීමෙනි. එමෙන්ම සූත්‍රයෙහි අර්ථය විවරණය කර ගැනීමෙනි.

විශාලා මහනුවර දුර්භික්ෂ, රෝග, අමනුෂ්‍ය නම් වූ තුන් බිය පැතිරිණි. මිනිස්සු සිය ගණනින් මැරී ගියෝය. ලිච්ඡවී රජදරුවෝ බිම්බිසාර රජුගේ සහායෙන් විශාලා මහනුවරට වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළහ. බුදුරජාණන් වහන්සේ ආරාධනාව පිළිගෙන පන්සියයක් භික්ෂූන් වහන්සේලා සමඟ වේළුවනාරාමයේ සිට වැඩම කළහ. බුදුරජාණන් වහන්සේ ගංගානම් නදියෙන් එතෙර වෙනවාත් සමඟම පොකුරු වැස්සක් වැස මළ සිරුරු සියල්ල සේදී ගොස් විශාලා මහනුවර පිරිසිදු විය. බුදුරජාණන් වහන්සේ පාත්‍රයට පැන් පුරවා ආනන්ද ස්වාමීන් වහන්සේට එය ලබා දී රතන සූත්‍රය උගන්වා මුළු නුවරටම පැන් ඉසින ලෙස වදාළහ. මෙම පිරිත සජ්ඣායනා කරමින් පැන් ඉසින්නේ සෑම පැන් බිංදුවක්ම රෝගීන් මත වැටිණ. ඒ සියලු දෙනා ඒ මොහොතේම සුවපත් වූහ. බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවරට වැඩිය විට, දෙවියෝත් බ්‍රහ්මයෝත් එහි එක් වූහ. සියලු අමනුෂ්‍යයෝ පලා ගියහ. බුදුරජාණන් වහන්සේ දින හතක් එහි වැඩ සිට සෑම දිනකම රතන සූත්‍රය සජ්ඣායනා කළහ. ඒ දේශනා අවසානයේ අසූහාර දහස බැගින් මාර්ග ඵල නිවන් සුව සාක්ෂාත් කළ බව සඳහන් වේ. මෙම රතන සූත්‍රය ආරක්ෂාමය පිරිතක් හැටියටද දේශනා කර තිබෙන්නේ ඒ නිසාමය. විශාලා මහනුවර නැවතත් පෙර පරිදිම සශ්‍රීක විය. එහි වැසියෝ දෙවියන් බඳු ශරීර වර්ණ ඇත්තෝ වූහ

මෙම රතන සූත්‍ර දේශනාවේ ගාථා 17 ක් අඩංගු වෙයි. ඉන් මුල් ගාථා දෙකෙන් ආරාධනාවක් සහ අනුශාසනාවක් කියවෙයි. මැද ගාථා

දොළහ තුළ බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ ඇතුළත් සත්‍ය ක්‍රියාව සමන්නාගත වෙයි. අවසන් ගාථා තුනෙන් සක් දෙව් රජතුමා රත්නත්‍රයට නමස්කාර කරන ආකාරය දැක්වෙයි. තථාගත බුදුරජාණන් වහන්සේ, උතුම් ශ්‍රී සද්ධර්මය, සහ ආර්ය මහ සඟ රුවනේ උත්තමවූ ගුණ අවබෝධ කරගත් ජනයා විසින් සම්මා සමාධිය උපදවා ගැනීමෙන්ද, ඉන් අනතුරුව විදර්ශනා වැඩීමෙන් ද ධර්මාවබෝධය කොට මාර්ග පිළිවෙළින් අමා මහ නිවන් අවබෝධ කර ගත්හ. මේ නිසා ලෞකික වශයෙන් ඇති විය හැකි සහ ඇති වූ කායික මානසික දුක්ඛ දෝමනස්සයන්ගෙන් බැහැරවීම පිණිසත්, අමනුෂ්‍ය විපත් වලින් මිදීම පිණිසත්, ස්වාභාවික විපත් වලින් ආරක්ෂාව පිණිසත් මෙම රතන සූත්‍ර දේශනාව උතුම් වූ ධර්ම ඖෂධයකි. මෙම උතුම් සූත්‍ර දේශනාව අවබෝධයෙන් යුතුව සජ්ඣායනා කිරීමෙන් ද, පිළිවෙත් මාර්ගයට යොමු කරගැනීමෙන් ද, මනා ගුණ ලැබිය හැකි බව පැහැදිලිය.

"කම්මට්ඨාන විනිමුත්තාහි ධම්ම දේසනා නාම නත්ථි" කම්මට්ඨාන දේශනාවකින් තොර ධර්ම දේශනාවක් නම් නැත යනුවෙන් සඳහන් පරිදි මෙම රතන සූත්‍ර දේශනාවත් ලෞකික දියුණුව, අභිවෘද්ධිය පිණිස මෙන්ම රාගාදී කෙලෙසුන් නසා ලෝකෝත්තර සුව පිණිස හේතුවන අති ශ්‍රේෂ්ඨ වූ කර්මස්ථාන සූත්‍රයකි.

මෙම සූත්‍ර දේශනාව සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම අර්ථ විවරණය කරමින්, සාධු දැක්ම - (3) නමින්, පරිණත ඉංග්‍රීසි භාෂා ආචාර්යවරියක් මෙන්ම ලේඛිකාවක් වූ සීතා නන්දනී ගුණතිලක මැතිනිය සම්පාදනය කොට ඇත. මෙයට පෙරද බුදු දහම ඇසුරු කරගෙන ග්‍රන්ථකරණයෙහි නියුක්ත වූ එතුමිය, මෙවරද එම මඟම අනුගමනය කරමින් තමාද දහමින් සැනසෙමින්, අන් අයද ඒ උතුම් වූ දහම් මඟට යොමුකරවීමට ප්‍රශංසනීය වූ උත්සාහයක් දරා ඇත. මෙම සත් ක්‍රියාව බුදු සසුනෙහි වැඩ වසන කල්‍යාණවූත්, සත්පුරුෂවූත් ශ්‍රාවිකාවකගේ මෙහෙයක් බව සඳහන් කරමි.

උතුම් තෙරුවන් සරණයි.
කාරුණික වූ,
ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ,
සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන, - බත්තරමුල්ල.

ස්තුතිය

තිලෝගුරු සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශිත
අසූහාර දහසක අමිල වූ නිර්මල ධර්මස්කන්ධයෙන්
අල්ප මාත්‍රයක වුවද ගැබ්ව ඇති ශ්‍රේෂ්ඨත්වය සහ
යථාර්ථවාදී බව පුහුදුන් සැමගේ ලෞකික මෙන්ම
ලෝකෝත්තර සුවය දක්වා විහිදී යන ආකාරය,
ධර්ම ගෞරවයට සහ දේශන ගාම්භීරත්වයට සුළු හෝ පලුද්දක්
නොවන අයුරින් එළි දැක්වීම මාගේ මූලික අරමුණ වූයෙන්,
එම අභිප්‍රාය සාක්ෂාත් කරගැනීමට සහාය දැක්වූ
අති උතුම් මහා සංඝ රත්නයට, දහම් කරුණු සාකච්ඡා කිරීමේ දී
සහ මුද්‍රණ කටයුතු සම්පාදනයෙහිලා ඉමහත් කැපවීමකින්
කටයුතු කළ සුපින්වත්
සුනේත්‍රා හෙට්ටිආරච්චි මහත්මියට,
සදහම් ග්‍රන්ථකරණය සඳහා නන් අයුරින් සහාය දැක්වූ
නිමල් ගුණතිලක මහතාට, තාක්ෂණ සහාය ලබාදෙන ආචාර්ය
සදේව ගුණතිලක පුතණුවන්ට සහ සදහම් පිපාසිත
ජන සමාජයකට ග්‍රන්ථ පරිශීලනය සඳහා යොමු කිරීමේ දී
ඒ සඳහා ඉමහත් දායකත්වයක් ලබාදෙන
ක්‍රිෂාන් ගුණතිලක පුතණුවන්ට
පුණ්‍යානුමෝදනා සමගින් කෘතඥතාව පුදකරමි.

MRS : K. SEETHA N. GOONETILLEKE
DIRECTOR
Parents Memorial Scholarship Foundation
392/2, Perera Mawatha,
Kotuwegoda - Rajagiriya.
Tel: 0112877950

හැඳින්වීම

Introduction

මෙම සාධු දැක්ම-The excellent View" ග්‍රන්ථ පෙළෙහි "සාධු" යන වචනයේ සිට අති උතුම් ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් බාල තරුණ වැඩිහිටි පුහුදුන් සැමගේ දෘෂ්ටියට ගෝචර වන පරිද්දෙන් පාලි, සිංහල, සහ ඉංග්‍රීසි භාෂා අනුසාරයෙන් ගද්‍ය මෙන්ම පද්‍යයෙන්ද ඉදිරිපත් කෙරෙන අතර එය සදහම් පිපාසිත පුහුදුන් ජනයාගේ සංසිඳීම පිණිස සැකසෙන ග්‍රන්ථ මාලාවකි.

ප්‍රථම මුද්‍රණය තුළ 'සාධු' යන පාලි වචනයේ සිට සරළව, ශ්‍රේෂ්ඨ දැක්ම, නමස්කාරය, තෙරුවන් සරණ යාම, පඤ්ච ශීලය, ත්‍රිවිධ රත්නයේ අසහාය ගුණ ස්කන්ධය සහ ආශිර්වාද බලය, නව අරහාදී බුදුගුණ, මා පිය වන්දනා ගාථා, ධම්ම පදයේ ශ්‍රේෂ්ඨ ගාථා රත්නයන් කිහිපයක් සහ 'යායුතු මග' ආදී කොටස් අන්තර්ගතය.

එම ග්‍රන්ථය 'දහම' දෛනික ජීවිතය තුළින් දැකීමට මහත්සේ ඉවහල් වී ඇති බව පාඨක ප්‍රතිචාරයන්ගෙන් මනාසේ අවබෝධ වූයෙන්, 'සාධු දැක්ම - The excellent View -(2) -(දෙවන ග්‍රන්ථය) මෛත්‍රිය හෙවත් මිතුරු බව තේමා කරගනිමින් කරණීය මෙත්ත සූත්‍රය ඇසුරෙන් ඉදිරිපත් කෙරිණි.

රතන සූත්‍රය අනුසාරයෙන් සම්පාදනය කිරීමට අදහස් කළ මෙම 'සාධු දැක්ම (3) - The excellent View (3) තුළින් මහානුභාව සම්පන්න ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ සමුදාය එළිදක්වෙන අතර එහි ගැබ්ව ඇති සත්‍යයේ බලයෙන් දෛනික ජිවිතයේ අභියෝග හමුවේ ලද හැකි අසිරිමත් සැනසුම විදහා දක්වෙයි. මෙය සදහම් පිපාසිත ප්‍රඥාවන්ත ජන සමාජය වෙත පිදෙන සදහම් පඬුරකි.

---- කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක ----

පටුන

Contents

1 රතන සූත්‍රය (ගාථා 1-17 දක්වා)
Jewel Discourse- (verses 1-17)

2 ප්‍රාර්ථනා සහ ආරක්ෂා ගාථා
(wishes & verses of protection)

3 විවරණය
Commentary

4 නිදානය
The origin

5 රතන සූත්‍රය තුළින් මතුකොට දැක්වෙන ආර්ය ගුණ වරුණ
Commentary of High lighted Noble qualities in details

6 අනූපමේය රත්නය - Unique Treasure

7 භාවිතයෙන් ලද හැකි ඵල
Vivid result of utilization

8 සත්‍යයේ බලය
Power of Truth

9 '' සතර වර්ගෙම නිවන් දක්නට .... ''කවි

10 සතර අවිජහිත ස්ථාන වන්දනා ගාථා
Four Places of worship that should not be missed by devotees

11 රත්නමාලී ගාථාත්‍රය

(1)

රතන සූත්‍රය (ගාථා 1-17)

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිවඅන්තලික්ඛේ
සබ්බේ ව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

බිම වසන්නා වූ හෝ අහසෙහි වසන්නා වූ හෝ
යම් අමනුෂ්‍යයෝ දැන් මෙහි රැස්ව සිටිත්ද,
ඒ සියලු දෙන සතුටු සිත් ඇත්තෝ වෙත්වා!
තවද, අප කියන දේ අසත්වා !

Yānīdha bhūtāni samāgatāni
Bhummāni vā yāni va antalikkhe
Sabbeva bhūtā sumanā bhavantu
Athopi sakkacca sunantu bhāsitam

Whatever beings(non humans)are gathered here
whether terrestrial or celestial,
May they all be happy and joyful!
And also, listen attentively to my words.

2 තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තොච හරන්ති යේ බලිං
තස්මාහි නේ රක්ඛථ අප්පමත්තා

අමනුෂ්‍යයෙනි ! සියල්ලෝම මෙය අසව්,
මනුෂ්‍ය සමූහයාට මෛත්‍රී කරව්,
දිවා රාත්‍රී ඔබට පිං පෙත් දී පුද පූජා පවත්වන
ඒ මනුෂ්‍යයින් අප්‍රමාදව ආරක්‍ෂා කරව්

Tasmā hi bhūtā nisāmetha sabbe
Mettam karotha mānusiyā pajāya
Divā ca ratto ca haranti ye baliṃ
Tasmā hi ne rakkhatha appamattā

Listen here, all beings!
Show your loving-kindness to those
humans who,
day and night, bring offerings to you.
Therefore, guard them diligently.

3. යං කිංචි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙලොව හෝ සෙසු දෙව්‍ලොවක අමිල වස්තුවක්
මාණික්‍යයක්, හෝ නිධානයක් ඇත් ද
ඒ කිසි තැනක තථාගතයන් හා සමාන වූ රත්නයක්
ඒකාන්තයෙන්ම නැත.
මෙම කරුණාද බුදුරජුන් කෙරෙහි වූ
උතුම් රත්න භාවයකි.
ඒ සත්‍ය බලයෙන් සියලු දෙනාටම සෙත් වේවා !

Yam kiñci vittam idha vā huram vā
Saggesu vā yam ratanam panītam
Na no samam atthi tathāgatena
Idam pi Buddhe ratanam panītam
Etena saccena suvatthi hotu

Whatever treasure is here or beyond,
or the precious jewel in the heavens,
none is equal to the Enlightened one.
In the Buddha is this precious jewel.
By this truth, may there be well-being!

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ශාක්‍ය මුණීන්ද්‍රයාණන් වහන්සේ කෙලෙස් නසා
සමාධියෙන් එකඟ වූ සිත් ඇතිව
උතුම් නිවන නුවණින් අවබෝධ කළේද
ඒ නිර්වාණ ධර්මය හා සමාන වූ රත්නයක් නැත.
මෙම කරුණද ධර්මයෙහි පවත්නා උතුම් රත්න භාවයකි.
ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Khayam virāgam amatam panītam
Yadajjhagā sakyamuni samāhito
Na tena dhammena sam'atthi kiñci
Idam pi dhamme ratanam panītam
Etena saccena suvatthi hotu

The calm Sakyan sage found cessation,
dispassion, the deathless the sublime
There is nothing equal to this state.
In the Dhamma is this precious jewel.
By this truth, may there be well-being!

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ ඉතා පිරිසිදු යමක්
විශිෂ්ඨ යැයි දේශනා කළ සේක්ද,
එය ආනනතරික සමාධිය යි කියති.
ඒ මාර්ග සමාධිය හා සම වූවත් නැත.
මෙම කරුණද ධර්මයෙහි උතුම් රත්න භාවයකි.
ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන් හට සෙත් වේවා !

Yam buddhasettho parivannayi
sucimādhi-mānantari-kaññamāhu
Samādhinā tena samo na vijjati
Idam pi dhamme ratanam panītam
Etena saccena suvatthi hotu

That purity praised by the Supreme Buddha,
called concentration with immediate result.
That concentration has no equal.
In the Dhamma is this precious jewel.
By this truth, may there be well-being!

6. යේ පුග්ගලා අට්ඨ සතම්පසත්තා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතෙන සච්චෙන සුවත්ථි හෝතු

යම් මාර්ගස්ථ පුද්ගලයින් 8 දෙනෙක් උතුමන් විසින් පසසන ලද්දාහු ද, ඔවුන් (සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන) යුගල 4 වෙති. බුද්ධ ශ්‍රාවක වූ උන් වහන්සේලා පූජා ලැබීමට සුදුසුය. උන්වහන්සේලාට දෙන දානය මහත් ඵලය. මෙම කරුණෙද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි.

ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Ye puggalā attha satam pasatthā
Cattāri etāni yugāni honti
Te dakkhineyyā sugatassa sāvakā
Etesu dinnāni mahapphalāni
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

The eight individuals praised by the good,
these four pairs are the gift worthy,
disciples of the Enlightened One.
Gifts given to them yield abundant fruit.
In the Sangha is this precious jewel
By this truth, may there be well-being!

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්ඛාමිනො ගොතම සාසනම්හි
තෙ පත්ති පත්තා අමතං විගයිහ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථී හෝතු

යමෙක් ගෞතම බුදු සසුනෙහි, ශීලයෙහි මනාව පිහිටියා වූ ද, (සමාධියෙන්) දැඩි සිත් ඇතිව සියලු කෙලෙසුන්ගෙන් තුරන් වූවාහු ද, ඔවුනු ඉලක්ක කරගත් රහත් ඵලයට බැස නිදහසේ නිවන් සැප වළඳන්නාහුය. මෙම කරුණාද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි. ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Ye suppayuttā manasā dalhena
Nikkāmino gotama sāsanamhi
Te pattipattā amatam vigayha
Laddhā mudhā nibbutim bhuñjamānā
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

With firm mind, applying themselves
to Gotama's teaching, free of passion,
they reach the goal; plunged in the deathless,
they enjoy supreme peace.
In the Sangha is this precious jewel.
By this truth, may there be well-being!

8. යථින්දඛීලො පඨවිං සිතොසියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදාමි
යො අරිය සච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

පොළවේ සිටුවනු ලැබූ යම් ශක්තිමත් කණුවක්
සතර දිගින් හමන සුළඟින් නොසෙල්විය හැක්කේද
ආර්ය සත්‍ය අවබෝධ කොට ගත් උතුම් පුරුෂයා
ඒ හා සමානය.
මෙම කරුණද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවයකි..
ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Yathindakhīlo pathavim sito siyā
Catubbhi vātehi asampakampiyo
Tathūpamam sappurisam vadāmi
Yo ariyasaccāni avecca passati
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

As a firm post sunk in the earth
cannot be shaken by the four winds;
So is the superior person who
thoroughly sees the Noble Truths is similar.
In the Sangha is this precious jewel.
By this truth, may there be well-being!

9. යෙ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යමෙක්, ගැඹුරු නුවණැති බුදුරජුන් විසින් මනාකොට දෙසූ
ආර්ය සත්‍යයන් තමා කෙරෙහි ප්‍රකට කර,
අවබෝධ කර ගනිත්ද,
ඒ සෝවාන් පුද්ගලයෝ කිසිසේත් පමාවූවෝ නොවෙත්.
අටවන භවයක් නම් නොගනිති.
මෙම කරුණ ද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි.
ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Ye ariyasaccāni vibhāvayanti
Gambhīrapaññena sudesitāni
Kiñcāpi te honti bhusappamattā
Na te bhavam atthamam ādiyanti
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

Those who comrehend the Noble Truths,
well taught by him of profound wisdom,
do not undergo an eighth birth,
In the Sangha is this precious jewel.
By this truth, may there be well-being!

10. සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කාය දිට්ඨි විචිකිච්ඡිතංච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡ චාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

එම දර්ශන සම්පත්තිය සමගම ඔහු විසින් සංයෝජන ධර්ම 3ක් දුරු කරන ලද්දාහු වෙති. එනම් ආත්ම දෘෂ්ඨිය, බුද්ධාදි කරුණු පිළිබඳ සැකය, අන්‍ය ආගම් ව්‍රත තුලින් නිවන් දැකිය හැකිය යන මිත්‍යා විශ්වාසය යි. එමෙන්ම ඔහු සතර අපායෙන්ද නිදහස් වූයේ වෙයි. බරපතල පව් සය ද නොකරන්නෙක් වෙයි. මෙම කරුණ ද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි. ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා

Sahāvassa dassana sampadāya
Tayassu dhammā jahitā bhavanti
Sakkāyaditthi vicikicchitañ ca
Sīlabbatam vāpi yadatthi kiñci
Catūhapāyehi ca vippamuto
Cha cābhithānāni abhabbo kātum
Idam pi saṅghe ratanam panītam
Etena saccena suvatti hotu

For one who has attained to vision three states are at once abandoned: view of self, doubt and clinging to needless rules and rituals. Freed from the four states of misery, He can't do six kinds of major evil acts. In the Sangha is this precious jewel.

By this truth, may there be well-being!

11. කිඤ්චාපි සො කම්මං කරෝති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බෝ සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සෝවාන් පුද්ගල තෙම කිසියම් ප්‍රමාදයකින් හෝ
කයින්, වචනයෙන් සිතින්
සුළු හෝ පාපයක් කළේ වී ද, එය නොසඟවයි.
මෙම කරුණ ද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි.
ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !

Kiñcāpi so kammam karoti pāpakam
Kāyena vācā uda cetasā vā
Abhabbo so tassa paticchādāya
Abhabbatā ditthapadassa vuttā
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

Though he might do any evil deed
by body, speech or mind he can not hide it:
such is impossible for one who has seen the path.
In the Sangha is this precious jewel.
By this truth, may there be well-being!

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ග්‍රීෂ්ම ඍතුවේ ප්‍රථම මාසයෙහි, පිපුණු මල් ඇති වන ලැහැබක් යම් සේ බබළයි ද, එසේ උපමා කොට ඇති පරම සුව දෙන **උතුම් නිර්වාණ ධර්මය, ලෝ සතුන්ගේ හිත සුව පිණිස බුදුරජාණන් වහන්සේ දෙසූ සේක.** මෙම කරුණාද බුදුරජුන් කෙරෙහි වූ උතුම් රත්න හාවයකි. **ඒ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවා !**

Vanappagumbe yathā phussitagge
Gimhānamāse pathamasmim gimhe
Tathūpamam dhammavaram adesayi
Nibbānagāmim paramam hitāya
Idam pi Buddhe ratanam panītam
Etena saccena suvatthi hotu

Like woodland crowns in full of blossom
in the first heat of the summer season
is the sublime Dhamma that he taught
leading to Nibbāna; the highest good.
In the Buddha is this precious jewel.
By this truth, may there be well-being!

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි ~~ධම්මේ~~ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ශ්‍රේෂ්ඨ වූ, නිවන දන්නා වූ, නිවන දෙන්නා වූ,
නිවනට පමුණුවන්නා වූ, ඒ උතුම් ශ්‍රී සද්ධර්මය,
අසමාන වූ බුදු පියාණන් වහන්සේ දේශනා කළ සේක.
මෙම කරුණාද ධර්මය කෙරෙහි වූ උතුම් රත්න භාවයකි
ඒ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවා !

Varo varaññū varado varāharo
Anuttaro dhammavaram adesayi
Idam pi Buddhe ratanam panītam
Etena saccena suvatthi hotu

The Excellent One, the Knower, the Giver,
the bringer of the sublime,
taught the inspirational doctrine; Dhamma.
In the Buddha is this precious jewel.
By this truth, may there be well-being!

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායං පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හොතු

යමෙකුගේ පුරාණ කර්මය ගෙවීගියේද, අලුත් කර්ම හටගැනීමකුත් නැද්ද, අනාගත භාවයෙහි නොඇලුණු සිත් ඇත්තෝද, ඒ රහතන් වහන්සේලා නැවත උත්පත්තිය ක්ෂය කළාහු වෙත්.. වැඩෙන ආශා නැත්තෝය. ධෛර්යවන්ත. වූ උන්වහන්සේලා, පහන මෙන් නිවී යති. මෙම කරුණද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය කි. **ඒ සත්‍ය බලයෙන් සියලු ප්‍රාණීන්ට සෙත් වේවා !**

Khīnam purānam
navam natthi sambhavam
Viratta cittā āyatike bhavasmim
Te khīnabījā avirūlhicchandā
Nibbanti dhīrā yathā'yam padīpo
Idam pi sanghe ratanam panītam
Etena saccena suvatthi hotu

Their past is extinct with no new arising their minds not pinch to a future birth, their desires do not grow more; the wise ones with their seeds destroyed, go out even as the lamp does. In the Sangha is this precious jewel.

On account of this truth, may there be well-being!

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු

(සක් දෙව් රජුගේ ප්‍රීතිය)

බිම වසන්නා වූ හෝ අහසෙහි වසන්නා වූ හෝ
යම් අමනුෂ්‍යයෝ දැන් මෙහි රැස්ව සිටිත්ද.
දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත නම් වූ
බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමු.

Yānīdha bhūtāni samāgatāni
Bhummāni vā yāni va antalikkhe
Tathāgatam devamanussa-pūjitam
Buddham namassāma suvatthi hotu

[Sakka's exultation:]

We beings that are here assembled,
whether terrestrial or celestial,
We salute the Perfected Buddha,
who is honoured by gods and men.
May there be well-being!

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

බිම වසන්නා වූ හෝ අහසෙහි වසන්නා වූ හෝ
යම් අමනුෂ්‍යයෝ දැන් මෙහි රැස්ව සිටිත්ද.
දෙව් මිනිසුන් විසින් පුදන ලද
තථාගත ධර්ම රත්නයට නමස්කාර කරමු.

Yānīdha bhūtāni samāgatāni
Bhummāni vā yāni va antalikkhe
Tathāgatam devamanussa-pūjitam
Dhammam namassāma suvatthi hotu

We beings that are here assembled,
whether terrestrial or celestial,
salute the Enlightening Dhamma,
which is honoured by gods and men.
May there be well-being!

17. යානීධ භූතානි සමාගතානි
භූම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

බිම වසන්නා වූ හෝ අහසෙහි වසන්නා වූ හෝ
යම් අමනුෂ්‍යයෝ දැන් මෙහි රැස්ව සිටිත්ද.
දෙව් මිනිසුන් විසින් පුදන ලද
සංඝ රත්නයට නමස්කාර කරමු.

Yānīdha bhūtāni samāgatāni
Bhummāni vā yāni va antalikkhe
Tathāgatam devamanussa-pūjitam
ngham namassāma suvatthi hotu

We beings that are here assembled,
whether terrestrial or celestial,
Salute the Noble sangha,
Who is honoured by gods and men.
May there be well-being!

(2)

(ප්‍රාර්ථනා සහ ආරක්ෂා ගාථා)

(Verses of protection)

එතෙනසච්ච වජ්ජේන - දුක්ඛාවූප සමෙන්තුමේ
මෙම සත්‍යයේ බලයෙන් සියලු දුක් පීඩා දුරු වේවා !

Etena saccavajjena - dukka vupa samantu me
By the power of this truth may my sufferings subside

එතෙනසච්ච වජ්ජේන - භයාවූප සමෙන්තුමේ
මෙම සත්‍යයේ බලයෙන් සියලු බිය දුරු වේවා !

Etena saccavajjena - bhaya vupa samantu me
By the power of this truth may my fears subside

එතෙනසච්ච වජ්ජේන - රෝගා වූප සමෙන්තුමේ
මෙම සත්‍යයේ බලයෙන් සියලු රෝග දුරු වේවා !

Etena saccavajjena - roga vupa samantu me
By the power of this truth may my illness subside

සබ්බීතියෝ විවජ්ජන්තු	සියලුම විපත් දුරුවේවා !
සබ්බ රෝගෝ විනස්සතු	සියලුම රෝග දුරුවේවා !
මා මේ භවත් අන්තරායෝ	බාධක කරදර ඇති නොවේවා !
සුඛී දීඝායුකෝ භව	සතුට සහ දීර්ඝායුෂ ලැබේවා !

Sbbitiyo vivajjantu
Subbarogo vinassatu
Ma me bhavathu antarayo
sukhi dighayuko bhava

May all calamities be warded off, May all illness be dispelled, May no obstacles hinder me, May I live long & happy

හවතු සබ්බ මංගලම්	සියලු යහපත වාසනාව උදා වේවා !
රක්ඛන්තු සබ්බ දේවතා	සියලු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවා !
සබ්බ බුද්ධානු භාවේන	සියලු බුදු වරුන්ගේ ආනුභාවයෙන්
සදා සොත්ථී භවන්තු මේ	මා වෙත සතුට සැපත ලංවේවා !

Bhawatu sabba mangalam - Rakkhantu sabba devata
Sabbabuddanubhavena - Sada sotti bhavantu me

May all good fortune come on my way, May all the deities protect me, By all the power of Buddha, May I always enjoy & well-being

හවතු සබ්බ මංගලම්	සියලු යහපත වාසනාව උදා වේවා !
රක්ඛන්තු සබ්බ දේවතා	සියලු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවා !
සබ්බ ධම්මානු භාවේන	සියලු ධර්ම රත්නයේ ආනුභාවයෙන්
සදා සොත්ථී භවන්තු මේ	මා වෙත සතුට සැපත ලංවේවා !

Bhawatu sabba mangalam - Rakkhantu sabba devata
Sabba Dhammanu bhavena - Sada sotti bhavantu me

May all good fortune come on my way, May all the deities protect me, By all the power of Dhamma, May I always enjoy & well-being

හවතු සබ්බ මංගලම්	සියලු යහපත වාසනාව උදා වේවා
රක්ඛන්තු සබ්බ දේවතා	සියලු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවා
සබ්බ සංඝානු භාවේන	සියලු සංඝානු භාවයෙන්
සදා සොත්ථී භවන්තු මේ	මා වෙත සතුට සැපත ලංවේවා !

Bhawatu sabba mangalam - Rakkhantu sabba devata
Sabba Sanghanu bhavena - Sada sotti bhavantu me

May all good fortune come on my way, May all the deities protect me, By all the power of Sangha, May I always enjoy & well-being

(3)

විවරණය
Commentary

ගාථා රත්නයන් 17 ක් අන්තර්ගත සත්‍යක්‍රියාවක් වශයෙන් සකස් වී ඇති මෙම රතන සූත්‍රයේ ආරම්භක ගාථා 2, අහසේ සහ භූමිගතව සිටින සියලුම අමනුෂ්‍යයින් වෙත කරනු ලැබූ ආරාධනයකින් සහ දේශනාව ශ්‍රවණය කිරීමට පෙර සියලු භූතයන්ගේ සිත් සතන් පවිත්‍ර කර ගන්නා ලෙස කරන ලද කෙටි අනුශාසනාවකින් ද සමන්විතය.

අවසාන ගාථාත්‍රය සක් දෙව් රජු විසින් ආකාසයේ සහ භූමියෙහි වසන සියලු භූතයන් අමතා, ප්‍රකාශිත අදහසක් මෙන්ම විධානයකි. තථාගතයන් වහන්සේ දෙව් මිනිසුන් විසින් පුද ලබන්නා වූ උත්තමයෙක් බව සඳහන් කරමින් රැස්ව සිටි සියලු භූතයින් සමග බුදුන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත් සක් දෙව් රජ නමස්කාර කමින් සෙත් පැතූ ආකාරය විදහා දැක්වෙයි

සූත්‍රය තුළ අන්තර්ගත ඉතිරි ගාථා රත්නයන් 12 තුළින් ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණස්කන්ධය පිළිඹිබු වෙයි. තථාගතයන් වහන්සේගේ අපරිමිත බුද්ධ ගුණයත්, උන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශිත නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයේ ගුණයත් උන් වහන්සේගේ ශ්‍රාවක අෂ්ඨ ආර්ය පුද්ගල මහා සංඝ රත්නයේ ගුණයත් නිසා ත්‍රිවිධ රත්නය තුන් ලෝකයෙහිම ඇති සියලු රත්න වලට වඩා උතුම්රත්න බවට පත්ව ඇත. එම ගාථා රත්නයන්ගේ සත්‍යභාවය තහවුරු කරමින් සජ්ඣායනා කරනු ලැබූ එම රතන සූත්‍රයේ අන්තර්ගත සුවිශේෂී බලයෙන් විශාලා මහනුවර තුන් බිය දුරු වී සියලුම සත්වයින්ට, සැනසීම සඳහා කායික මානසික පසුබිම් සකස් වූ අයුරු විද්‍යාමාන වේ.

The 1st two verses are introductory. Here the Buddha addresses right away the audience present before commencing his discourse & determination based on the power of true statements.

The 2nd verse is the urgent advice of exhortation of Buddha gives to all those gods and deties present by urging them to

show their friendliness, benevolence and kindness to the human kind which is afflicted with 3 calamities of famine,evil spoil and diseases.

Next 12 verses reveal the noble qualities of Buddha, Dhamma & Sangha. After concentrating the greatness of all those 12 verses of Jewel discourse which points out the exclusive virtues in the 3 superb jewels Sakha thought that he also should recite something based on the superb Jewel for the well being of the city. So the last 3 verses were recited by Sakha.

☸ ☸ ☸

රතන සූත්‍රයේ අන්තර්ගත ගාථා 17 න් ධ්වනිතාර්ථ වන දෙස සවිස්තරාත්මකව බලන කල්හි සත්‍යයේ බලය වඩ වඩාත් තහවුරු වෙයි.

① මෙහි පැමිණ සිටින ආකාශවාසී හෝ භූමි වාසී සියලුම භූතයෝ පිරිසිදු යහපත් සිත් ඇත්තෝ වෙත්වා ! වෛරය, තණ්හාව, ද්වේශය වැනි කුරුරි චේතනාවලින් යුක්තව ධර්මය ශ්‍රවණය කිරීමෙන් නිසි ප්‍රතිඵල ලද නොහැකි බැවින්, යහපත් මනසක් ඇති කරගැනීමෙන් අනතුරුව මෙම ධර්මය මැනවින් ශ්‍රවණය කරත්වා ! **අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං**

Here the Buddha addresses right away the audience present before commencing his discourse to make their minds purify to get the best results and determine the power of true statements.

② දෙවන ගාථවෙන්ද සියලුම භූතයින් අමතා, දිවා රාත්‍රි දෙක්හිම තොප වෙනුවෙන් විවිධ පුද පූජා පවත්වන මිනිස් ප්‍රජාව කෙරෙහි අප්‍රමාදව කරුණාව දයාව දක්වන ලෙසටත්, ඔවුන් දුර්භික්ෂ, රෝග සහ අමනුෂ්‍ය බියෙන් පීඩාවට පත්ව සිටින මේ මොහොතේ අප්‍රමාදව ආරක්ෂා කරන ලෙසටත් අනුශාසනා කර ඇත. **තස්මාහි නේ රක්ඛථ අප්පමත්තා**

This is the urgent advice: exhortation of Buddha gives to

all those gods and deities present by urging them "Show your friendliness to human beings who bring you offerings day and night be kind to them (metta) ; arouse friendliness 'karothamanu' ,benevolence and kindness to this human kind (which is afflicted with the 3 calamities of famine, evil spirits,and deseases) **Therefore, guard them diligently.**

③ තෙවන ගාථාවේ සිට සත්‍යයේ බලයෙන් සෙත් පැතීම ඇරඹෙයි. මිනිස් ප්‍රජාව විසින් සිදු කරන ලද පූජා සත්කාර සිහිපත් කර දීමෙන් අනතුරුව ත්‍රිවිධ රත්නයේ ගුණ සමුදාය හුවා දක්වමින් එම ගුණ දෙලොවටම වැඩදායී සත්‍ය ගුණ බවත් එම සත්‍යයේ බලය නිසාම රත්න හෙවත් රුවන් බවට පත්ව ඇති බවත් පහදා දී ඇත. මෙකී සත්‍යභාවය පසක් කරමින් යහපතක් වේවා!යි සත්‍ය ක්‍රියා කිරීම රතන සූත්‍රයේ අරමුණයි. විපත් දුරුවීම සඳහා මෙම සත්‍ය වචනයේ සත්‍ය බලය සිහිපත් කරමින් සත්‍යක්‍රියා කරමින් රැස්ව සිටි සැමට ධර්මය අසන්නට සැලැස්වීය.

මිනිස් ලොවෙහි හෝ දෙව් ලොවෙහි හෝ අවශේෂ ලෝකයන්හි කිසියම් ධනයක් ශ්‍රේෂ්ඨ සහ උතුම් ලෙස සැලකෙයිද, ඒ කිසිවක් බුද්ධ රත්නය හා සමාන නොවේ. එය සත්‍යයකි. එම සත්‍යයේ බලයෙන් යහපතක්ම වේවා!

ඉදම්පි බුද්ධේ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු

Thus after pointing out to the god and deities how humans are helpful by making offerings and dedicating merits to them, the Budha commenced now to gradually invoke the virtues of the Buddha,Dhamma and Sanga for the disappearance of the calamity and for the Gods and humans to hear the Dhamma. Therefore he applies the power of true statement (sacca- vacana) by reciting the verses beginning with the 3rd stanza.

"Idam pi Buddhe ratanam panītam Etena saccena suvatthi hotu"

④ ධර්ම රත්නය පිළිබඳ වූ සත්‍ය ක්‍රියාව, සූත්‍රයෙහි එන 4 වන ගාථාවෙන් කියවෙයි. ශාක්‍ය මුණින්ද්‍රයන් වහන්සේ විසින් බෝධිමූලයෙහි දී සියලු කෙලෙස් දුරු කර, රාගය යලිත් මතු නොවන

ශ්‍රේෂ්ඨ වූ නිර්වාන ධර්මය පසක්කර ගන්නා ලදහ.

ඒ උතුම් නිර්වාන ධර්මයට සම කළ හැකි වෙනත් කිසිම රත්නයක් සකල ලෝක ධාතුවෙහි නැත. මේ සත්‍යානුභාවයෙන් ලෝ වැස්සනට සෙතක් ශාන්තියක් වේවා!යි කියා සෙත් පැතිම මෙම ගාථාරත්නයේ අදහසයි. තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරගත්, ක්‍ෂය, විරාග, අමත, පණීත, සමාහිත ගුණයන්ගෙන් යුක්ත මෙම නිර්වාන ධර්මයට සමාන වෙනත් දහමක් ලොව නැත. එය නිර්වාන ධර්මයෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයයි.

නතෙ න ධම්මේන සමත්ථි කිඤ්චි,
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

Thus after invoking the truth with the Budha's virtues (Budu guna) the Buddha commences now to invoke it with the virtous of the Teaching of Nibbana (Daham Guna) . Here Extinction, Dispassion, and deathlessness are all terms of Nibbana: more precisely here of the Buddha.

(5) 5 වන ගාථා රත්නයෙන් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මාර්ග ඥාන මාර්ග සමාධි පිළිබඳව කියැවේ. ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කළ පිරිසිදු වූ ආනන්තරික සමාධියට සම වූ වෙනත් සමාධියක් නැත. සෝවාන් මාර්ගයට අනතුරුවම සෝවාන් ඵලය ලැබෙන බැවින් සෝවාන් මාර්ගයෙහි තියෙන සමාධිය ආනන්තරික සමාධියයි. පිළිවෙළින් මාර්ග ඵල ලැබීමෙන් අනතුරුව ලබන සමාධිය මාර්ග සමාධියයි. මෙය පසුව බිඳ වටෙන්නා වූ සමාධියක් නොවේ. ධර්ම රත්නය කෙරෙහි පවත්නා වූ ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. ඒකාන්ත සත්‍යයකි. මෙම සත්‍යානුභාව බලයෙන් සෙතක් ශාන්තියක් වේවා!යි සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි.

ඉදම්පි ධම්මේ රතනං පණීතං ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

The purity prased by the Supreme Bhuddha commences now to invoke the truth with the virtues of the teaching of the supermundane path which unfailingly brings concentration.

There is nought comparable to this awareness. Here the Buddha means the person who concentrated with 4 Noble Truth. This precious jewel is the Dhamma. By the power of this truth may there be happiness. **"Idam pi Dhamme ratanam panītam Etena saccena suvatthi hotu"**

⑥ සූත්‍රයේ එන 6 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි.

සතංපසත්ථා - බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා සහ දිව්‍ය බ්‍රහ්ම ආදී සත්පුරුෂයන් විසින් ප්‍රසංශා කරන ලද ආර්ය පුද්ගලයෝ 8 දෙනෙකි. ඒ වූ කලී **සෝවාන් මාර්ගස්ථ සහ ඵලස්ථ, සකෘදාගාමී මාර්ගස්ථ සහ ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ සහ ඵලස්ථ, සහ අර්හත් මාර්ගස්ථ සහ ඵලස්ථ**, යනුවෙනි. ඔවුන් දන් ලැබීමට සුදුසුය. තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝය. ඔවුනට දන් පිදීමෙන් මහත් ඵල ලැබෙයි. **''ඒ තෙසු දින්නානි මහප්ඵලානි''**. මෙය අෂ්ඨ ආර්ය මහා සංඝයාගේ ඇති උතුම් රත්න භාවයකි. මේ සත්‍යානුභාවයෙන් ලෝ වැස්සනට සෙතක් ශාන්තියක් වේවා!යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි' **ඉදම්පි සංඝෙ රතනං පණීතං ඒතෙන සච්චේන සුවත්ථි හෝතු**

The Buddha commences now to invoke the truth with the virtuous of the orders of noble disciples. The 8 individuals mentioned here are the 8 noble (ariya) individuals who have realized one of the 8 supermundane stages of holiness; that is any of the 4 supermundane paths (magga) and the 4 supermundanefruit(phala) of these path.Precisely they are the noble individuals who realize the path & fruits. They are the disciples of Buddha and are worthy of offerings. Gifts given to them yield rich results. **This precious jewel is the Sangha.** By the asseveration of this truth may there be happiness. **"Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

⑦ සූත්‍රයේ එන 7 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි. චිත්ත සමාධියට පත්වීමේ දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව ශරීරය සහ ජීවිතය කෙරෙහි

පවා කිසිම ආකාරයේ බැඳීමකින් තොරව, කෙලෙස් නසමින් ගෞතම තථාගත සම්බුදු පියාණන් වහන්සේගේ බුද්ධ ශාසනයෙහි ප්‍රතිපත්ති වඩා රහත් බවට පැමිණ, අනිත්‍ය දැක අමිල වූ නිවන් සුවය නොමිලයේම ලබා එම නිවන් සුවය නිරතුරුවම භුක්ති විඳීම ආර්ය සංඝයාගේ ලක්‍ෂණයයි. - **ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා.** ඒ උතුම් රත්න භාවයේ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවා!යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි. **'ඉදම්පි සංඝෙ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු'**

The Buddha commences now to invoke the truth with the virtues of Arhanth who experience the bliss of the attainment of fruition. With the dedicated mind, applying themselves well in the special consideration of Buddha, free from defilement they have attained Arhanthship encountering the Deathless. They enjoy the peace of Nibbana freely obtained. This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **"Idam pi Sanghe ratanam panītam etena saccena suvatthi hotu"**

⑧ සූත්‍රයේ එන 8 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි.

සතර දෙසින් හමන සුළඟට කම්පා නොවන අයුරින්, ශක්තිමත් ලෙස පොළොවෙහි සිටුවන කණුවක් හෙවත් ඉන්ද්‍රඛීලයක් සේ සතර විධ සත්‍යය ප්‍රඥාවෙන් අවබෝධ කරගත් සත්පුරුෂයා කිසිවකින් කම්පාවට පත් නොවේ. මෙය ද ආර්ය සංඝයාගේ ලක්‍ෂණයයි. ඒ උතුම් රත්න භාවයේ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවා!යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසය.

'ඉදම්පි සංඝෙ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු'

The Buddha commences now to invoke the truth with the virtuous of the stream winner 'Sothapanna" As a post deeply rooted in the earth stands unshaken by the wind from the 4 quarters, I declare the righteous man who comprehends the

wisdom is never shaken This precious jewel is the Sangha. **By the asseveration of this truth may there be happiness. "Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

⑨ සූත්‍රයේ එන 9 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ සෝවාන් ආර්ය වහන්සේගේ ගුණයකි.

(''යො අරිය සච්චානි විභාවයන්ති'' - **Those who comprehend the Noble truth)** බුදුරජාණන් වහන්සේ ගැඹුරු ප්‍රඥාවෙන් දැක මැනවින් දේශනා කරනු ලැබූ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට උත්සාහ ගනිමින් සම්බුද්ධ ශාසනයෙහි යමෙක් සෝවාන් මාර්ග ඵල ලැබුවේ නම් කිසි ලෙසකින් ඔහු ආත්ම 8 ක් උපදින්නේ නැත., 'සත්තක්ඛත්තුපරම' සෝවාන් ඵලයට පත් ඒ තැනැත්තා නිර්වාණය සාක්ෂාත් කරගැනීමට මදක් ප්‍රමාද වුවද අටවන භවයක් දක්වා සංසාරයේ ගමන් නොගනී. මෙය සංඝ රත්නයේ ශ්‍රේෂ්ඨ ගුණානුභාවයකි. සත්‍යයකි. 'න තෙ භවං අට්ඨ මං ආදියන්ති'. එම සත්‍යානුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා! යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.

'ඉදම්පි සංඝෙ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු'

The Buddha commences now to invoke the truth with particular virtuous of stream winner who do not take up an eigth rebirth. Those who realized the 'Noble Truth' well taught by him who is well profound in wisdom (the Buddha), although they might be exceedingly heedless they (sattakkattuparama) will not take an existence in the realm of sense spheres after the seventh birth . This precious jewel is the Sangha. **By the asseveration of this truth may there be happiness. "Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

(ආර්ය පුද්ගලයින් 108 දෙනෙකු ලෙසට ද වර්ගීකරණය කෙරෙයි.)

ඒක බීජ, කොලං කොල, සත්තක්ඛත්තු පරම යනුවෙන් සෝවාන් පුද්ගලයින් තිදෙනෙකි. කාම භව, රූප භව, අරූප භව යන තුන් භවයන්හි ඵල ඇති සෙදගැමි පුද්ගලයෝ 3 දෙනෙකි. ඒ සියල්ලෝම චතුර්විධ (4) ප්‍රතිපදාවන්ගේ වශයෙන් 24 කි.

අන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, සංඛාර පරිනිබ්බායි, අසංඛාර පරිනිබ්බායි, උද්ධංසෝත අකනිට්ඨාගාමී යනුවෙන් බඹලොව 5 දෙනෙකි. එසේම අතප්ප, සුදස්ස, සුදස්සී යන තුන් බඹලොව 15 දෙනෙකි. අකනිටා බඹලොව උද්ධංසොත පුද්ගලයා හැර ඉතිරි 4 දෙනෙකි. මෙලෙසින් අනාගාමී පුද්ගලයෝ 24 දෙනෙකි.

සුක්ඛවිපස්සක, සමථයානික ආදී වශයෙන් රහතුන් (2) දෙනමකි. මාර්ගස්ථ පුද්ගලයෝ (4) කි. මෙම සියල්ලෝම (54) ශ්‍රද්ධා - පඥාධුර වශයෙන් ද්විගුණ වන හෙයින් ආර්ය පුද්ගලයින් සංඛ්‍යාව 108 සේ වර්ගීකරණය කර ඇත

(10). සූත්‍රයේ එන 10 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද සෝවාන් ආර්ය වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි.

සෝතාපත්ති ඵලයට පත් වූ ඉහත ගාථා රත්නයෙන් පෙන්වා දුන් තැනැත්තා ස්වකීය නිවැරදි ආර්ය මාර්ග දර්ශනයෙන්ම සක්කාය දිට්ඨි, විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයෝජන 3 ප්‍රහීන කරයි. එනම් සතර අපාය ගමනින් සම්පූර්ණයෙන්ම මිදුනේ වෙයි. **මව මැරීම, පියා මැරීම, රහතුන් වහන්සේ ජීවිතක්ෂයට පත්කිරීම, තථාගත සිරුරේ ලේ සෙලවීම සහ සංඝ භේදය** යන පංචානන්තරිය කර්ම සහ නියත මිසදිටුකම වැනි සය ආකාර අභිඨාන අකුසල කර්ම කිසිවිටකත් සිදුනොවනු ඇත. මෙය ආර්ය සංඝයාගේ උතුම් රත්න භාවයකි. සත්‍යයකි. මෙම සෝවාන් ආර්ය සත්‍ය නමැති සංඝ රත්නයේ ශ්‍රේෂ්ඨ ගුණයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා! යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි. **'ඉදම්පි සංඝෙ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු'**

With his gaining of insight he abandons 3 states of mind; namely self-illusion,doubt and indulgence in meaningless rites and retuals. He is also fully freed from the 4 status of woe and incapable of committing the six major wrong doings such as Matricide, Patricide, The murder of Arhanth, The shedding of the Buddha's blood , Causing schism in the Sangha and Pernicious false beliefs (Niyata Micca Ditthi) . This precious

jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **"Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

(11) සූත්‍රයේ එන 11 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද සෝවාන් ආර්යයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි.

සෝතාපන්න වූ ආර්යයන් වහන්සේ නමක් සිත, කය වචනය යන තිදොරින් සුළු හෝ වරදක් වැරදීමකින් හෝ සිදු කළේ වී නම් වහාම ඒ තෙමේ පාපය අතහැර ආර්ය සංවරයෙහි පිහිටයි. තමන් කළ පාපය කිසිවිටක නොසඟවයි. වහාම පිරිසිදු බවට පත්වෙයි. මෙය ද ආර්ය සංඝයාගේ උතුම් රත්න භාවයකි. සංඝ රත්නයේ මෙම ශ්‍රේෂ්ඨ ගුණයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා! යි කියා සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි. 'ඉදම්පි සංඝෙ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථී හෝතු'

The Buddha commences now to invoke the truth with the stream winner's special virtue of not being able to conceal any evil action committed even by negligence. Thus he now shows that not only is a stream winner incapable of committing the 6 major misdeeds , but is also incapable of even concealing a slight evil action done by deed ,word or thought since it has been proclaimed that such concealing is impossible for one who has seen the path .(He is sothapanna, stream enterer, one who has attain the first stage of sanctity) . This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness.

"Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"

(After invoking the truth based on the determination upon the Sangha Jewel in regarding to various excellent qualities and virtues of noble persons included in the Sangha, the Buddha commences how to invoke the truth again on the determination upon the Buddha with reference to his excellence of experiencing the explanatory part of the Dhamma (Pariyaththi dhamma) by elucidation here in brief and elsewhere in other

discourses in more detail the superior virtuous of the 3 Jewels and the Dhamma that leads to Nibbana)

⑫ සූත්‍රයේ එන 12 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ තථාගතයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි.
ග්‍රීෂ්ම ඍතුවෙහි මුල් මාසයේ හෙවත් වසන්තයේ ගස් වැල්වල අතුපතර එකිනෙක පැටලීගිය වන ලැහැබක් ගස් මුදුන් මලින් බරව සුන්දරව පවතින විටක මී මැස්සෝ බඹර මැස්සෝ රොන් උරාගන්නා සේ මුළු ලොවටම දහම් සුවඳ විහිදුවමින් තථාගතයන් වහන්සේ නිර්වාණගාමී උතුම් දහමක් දේශනා කරන ලදී. භාග්‍යවතුන් වහන්සේ ගේ මෙම ශ්‍රේෂ්ඨානුභාව බලයෙන්, සත්‍යානුභාව බලයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා! යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.
'ඉදම්පි බුද්ධේ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු'

"As the woodland groves though in the early heat of the summer month are crowned with blossoming flowers even so is the sublime Dhamma leading to the calm of Nibbana which is taught by the Buddha for the highest good. This precious jewel is the Buddha. **By the asseveration of this truth may there be happiness. "Idam pi Buddhe ratanam panītam Etena saccena suvatthi hotu"**

⑬ සූත්‍රයේ එන 13 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයයි.

උත්තම, අති ශ්‍රේෂ්ඨ (වරෝ), සත්වයිනට විමුක්ති සුවය ලබාදෙන, ප්‍රඥා අධිෂ්ඨාන පිරිපුන් කරන්නා වූ (වරඤ්ඤූ), උතුම් ප්‍රතිපදාවට යොමු කරන්නා වූ (වරදෝ), උතුම් මාර්ගයට පමුණුවන්නා වූ (වරාහරෝ), අනන්තර වූ ශ්‍රේෂ්ඨ ධර්මයක් දේශනා කර තිබීම (අනුත්තරෝ ධම්මවරං අදේසයි) තථාගතයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයකි. මෙම සත්‍යයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා! යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි. 'ඉදම්පි බුද්ධේ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු'

The Buddha commences how to invoke the truth with his exclusive virtues in regards with the supermundane (Lokuththara)Dhamma. The peerless Excellent Buddha: the knower of Nibbana, the giver of Nibbana, the bringer of the Noble path taught the excellent Dhamma. This precious Jewel is the Buddha. **By the asseveration of this truth may there be happiness. "Idam pi Buddhe ratanam panītam Etena saccena suvatthi hotu"**

(14). සූත්‍රයේ එන 14 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ රහතන් වහන්සේලාගේ විශේෂ ගුණයකි. මෙම ගාථාව රතන සූත්‍ර සත්‍යක්‍රියාවේ අවසන් ගාථාවයි. මෙහි රහතන් වහන්සේගේ සුවිශේෂී ගුණයක් ඇතුළත් වේ. රහතන් වහන්සේගේ පැරණි කර්ම සියල්ලම අහෝසියි. (ඛීණං පුරාණං) අළුතෙන් කර්ම රැස් කිරීමක් ද නැත. (නවං නත්ථි සම්භවං). මතු භවයේ ඉපදීමේ ආශාවක් ද නැත. (වීරත්තචිත්තා ආයතිකෙ භවස්මිං) පුනර්භවයක් ඇතිවීමේ බීජ ක්ෂය කළ (තෙ ඛීණ බීජා) නැවත ඉපදීමේ කැමැත්තක් ද නොවන හෙයින් (අවිරූළ්හිච්ඡන්දා), පොල් තෙල් පහනක පහන් වැටිය දැල්වී අවසන් වූ පසු නිවී යන්නා සේ නිවී සැනසී නිවනට පැමිණෙති. එය අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවට පත් වීමයි. මෙය සංඝ රත්නය පිළිබඳ අසහාය ශ්‍රේෂ්ඨ ගුණයකි. සංඝයාගේ මෙම රත්න භාවයේ සත්‍යයෙන්ද ලෝකයට සෙතක් ශාන්තියක්ම වේවා! යනුවෙන් සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි 'ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චේන සුවත්ථි හෝතු'

The Buddha commences how to invoke the truth once more with the determination upon the Sangha in regard to the excellence of attaining "Nibbana" with no residue remaining (Anupadisesa Nibbana) for those disciples who have listened to the expounding of the Dhamma (Pariyatti Dhamma) practiced accordingly and attained the Supermundane (Lokuttara) Dhamma of Arhanthship. Their past(kamma) is exhausted, New (kamma) no more arises.Their mind to future becoming is unattached. Their germ (of re-birth consciousness) is died. They have no more desire for re-birth. Those wise men fade out (of existence) as the flame of the oil lamp (which has just faded away).

This precious jewel is the Sangha. **By the asseveration of this truth may there be well and happiness. "Idam pi Sanghe ratanam panītam -Etena saccena suvatthi hotu"**

15, 16 සහ 17 ගාථාත්‍රය සක් දෙව් රජ විසින් ප්‍රකාශ කරන ලද්දකි. ඛීණං' පුරාණං නවං නත්ථි සම්භවං ගාථාවෙන් සත්‍යක්‍රියාව අවසන වනවාත් සමගම වසංගත රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂ සියලු බිය පහව ගියෙන් ප්‍රීති ප්‍රමෝදයට පත් සක් දෙව් රජ එම ස්ථානයට පැමිණ අහසේ සහ භූමියේ රැස්ව සිටි සියලු භූතයන් අමතා තථාගතයන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත් (උතුම් තුනුරුවනට) නමස්කාර කරමින් යහපතක්ම වේවා!යි සෙත් පැතූ ආකාරය අවසාන ගාථා 3 න් පැහැදිලිය.

යානීධ භූතානි සමාගතානි - භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං - බුද්ධං නමස්සාම සුවස්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි - භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං - ධම්මං නමස්සාම සුවස්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි - භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දෙවමනුස්ස පූජිතං - සංඝං නමස්සාම සුවස්ථි හෝතු

Last 3 stanzas (15,16 ,17) of the Jewel Discourse were recited by The Lord of the God. After realizing that the Buddha applied the power of true statements based on the exclusive virtues in the superb jewels and brought well-being to the city, Sakha thought that he too should recite some thing based on the 3 superb jewels for the well being of the city. Thus he recited the last 3 verses beginning with **"Yānīdha bhūtāni samāgatāni"**

(4)

රතන සූත්‍රය - නිදාන කථාව
The Origin of the Jewel Discourse

බුදු සමයේ දී විශාලා මහනුවර ඉතා උසස් ශ්‍රී විභූතියක් දියුණු වී තිබුණි. සියලු සැපතින් පිරී ඉතිරී ගිය එම නගරයෙහි ජීවත්වූ ජනතාව සැපයෙන් ආඪ්‍යව සතුටින් ජීවත් වුණි. නමුත් පසුකාලීනව එම නුවර දුර්භික්ෂයක් (සාගතයක්) ඇති වී බොහෝ මිනිසුන් මැරෙන්නට පටන් ගැනිණි. පසුව වසංගත රෝගයක්ද පැතිරී මෙම විපත වඩාත් උග්‍ර වන්නට විය. එමපණකින් අවසන් නොවිණි. අමනුෂ්‍ය උපද්‍රවද පැන නැගෙන්නට විණි. දහස් ගණන් මිනිසුන් මරු මුවට පමුණුවමින් මුළු නගරයම අමු සොහොනක් සේ දිස් වන්නට විය. මෙම අවාසනාවන්ත භයානක තත්ත්වය දිනෙන් දින වඩාත් දරුණු වන්නට විය. නගර වැසියන් බුදුරජාණන් වහන්සේගේ පිහිට පතන්නට විය. රජගහ නුවර සිට බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් ඇතුළු විශාල සංඝ පිරිසක් සමගින් විශාලා මහනුවරට වැඩම කිරීමත් සමග විශාල වර්ෂාවක් ඇදහැලීමෙන් තැනින් තැන තිබූ මළ මිනි ගසා ගෙන යන්නට විය. නගරය පිරිසිදු වීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් ඇතුළු සංඝ රත්නය මෙම පිරිත් දේශනා කරමින්, පිරිත් පැන් ඉසමින් විශාලා මහනුවර වීථි සංචාරය කරමින් සෙත් පැතූහ. වර්ෂාව නිසා පිරිසිදු වූ නගරයෙහි අමනුෂ්‍යයෝ ද පලා යන්නට වූහ. රෝග බිය ද පහව යන්නට විය. සියලු දෙනාම සුවපත් වූහ.

(ප්‍රීතියට පත් සුවපත් වූ ජනතාව නගර මැද ධර්ම ශාලාවක් සකස් කොට බුදුරදුන් ප්‍රමුඛ මහ රහතන් වහන්සේ පන් සියයක් වඩමවා අසුන් ගත්හ. භාග්‍යවතුන් වහන්සේ නැවතත් රතන සූත්‍රය දේශනා කළ සේක. රට වැසියෝ සද්ධර්මය අවබෝධ කරගත්හ. අනතුරුව දින 6 ක් මෙම සූත්‍රය දේශනා කොට විසාලා නුවර වැසියනට සහ දහස් සංඛ්‍යාත ප්‍රාණීන්ට සෙත් පතා බුදුරදුන් ප්‍රමුඛ මහ රහතන් වහන්සේ රජගහ නුවර බලා වැඩම කරවීය)

During the period of Buddha Vesali city was developed highly in every ways. The inhabitant of this city led luxurious lives very happily and pleasingly. But later on there was a famine and it

highly influenced to the lives of poor folk specially causing death. Due to the presence of decaying corpses the evil spirits began to haunt the city. This calamity was followed by a pestilence: virulent deadly diseases. The miserable situation became worse day by day. Plagued (suffering) by these 3 fears of famine, non human beings and pestilence (deadly disease), the citizens sought (required/wanted)the help of the Buddha who was then living at Rajagaha. The Lord Buddha and Ananda Thera accompanied with number of disciples visited to Vesali city. When they approached it started to rain heavily and started to flow away all the dead stinking bodies. After that this Jewel Discourse was chanted by the Buddha. Venerable Ananda was given instructions as to how he should tour the city with the Licchavi citizens reciting the discourse as a mark of protection to the people of Vesali. Following the given instructions Venerable ananda Sprinkled sanctified water from the Buddha's own alms bowl. As a consequence the evil spirits were exorcised, the deadly diseases were subsided.

(The recovered citizens blissfully arranged a preaching hall in the middle of the city and invited the Buddha & his 500 disciples.The Jewel Discourse was chanted for 6 days continuously. By the power of this truth all the the citizens of Vesali became well beigns and understood the reality of Dhamma. At last the Buddha and his 500 disciples were taken back to Rajagaha.)

☸ ☸ ☸

(5)

රතන සූත්‍රය තුළින් මතුකොට දැක්වෙන ආර්ය ගුණ වරුණ
Commentary of High lighted Noble qualities

තථාගතයන් වහන්සේගේ නව අරහාදී බුදුගුණයන්ට වෙන්කර බෙදා දක්වනු ලැබූ අපරිමිත බුදු ගුණස්කන්ධයත්, උන්වහන්සේ විසින් දේශිත නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයත්, සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාගෙන් පැවත එන බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රශංසා කරනු ලැබූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයත් ලොවෙහි ජීවමානයි.

මෙම ත්‍රිවිධ රත්නයේ පවතින අනන්ත මහා ගුණස්කන්ධය සංක්ෂිපතව ඉදිරිපත් කෙරෙන රතන සූත්‍රය තුළින් විනිවිද දැකිය හැකි ආර්ය ගුණ සමුදාය කෙතරම් සත්‍ය හා බල සම්පන්නද යන්න විශාලා මහනුවරට දරුණු ලෙස බල පෑ තුන් බිය තුරන්කර රට වැසියනට ළඟා කර දුන් සෙත, ශාන්තිය හමුවේ මනාව පැහැදිලිය.

එවන් අති උතුම් ගුණස්කන්ධයක් මෙන් කුඩා ග්‍රන්ථයක් තුළ එන එක් පරිච්ඡේදයකින් එළි දැක්වීම කිසිසේත් කළ නොහැක්කකි. එහෙත් වත්මන් සමාජයේ සදහම් පිපාසිත ප්‍රශ්‍රාවන්ත ජන සමාජය වෙනුවෙන් සැකසෙන මෙම ග්‍රන්ථය එම ආර්ය ගුණස්කන්ධය පිළිබඳව යම් පමණක හෝ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වනු ඇත.

රතන සූත්‍රයේ එන 3 වන ගාථාවේ සිට 14 වන ගාථාව දක්වා ගැබ්ව ඇති මෙම උත්තරීතර ආර්ය ගුණ විස්තරාත්මකව අවබෝධ කටයුතුය. 3 සහ 12 වන ගාථාවන්හි සඳහන් පරිදි තථාගතයන් වහන්සේගේ උත්තරීතර බව ශ්‍රේෂ්ඨත්වය සියළුම ලෝක අභිභවා යයි. නව අරහාදී අපරිමිත ගුණස්කන්ධයකින් සමන්විත උන් වහන්සේට සම කළ හැකි රත්නයක්, මෙලොව හෝ සෙසු දෙව් ලොවක ඒකාන්තයෙන්ම නැත. 12 වන ගාථාවේ සඳහන් පරිදි පරම සුවදෙන, ලොව බබළන උතුම් නිර්වාන ධර්මය ද තථාගයන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ම දේශනා කළ සේක.

තුන් ලොවටම අග්‍ර වූ බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් දුරු වූ බැවින් ද, රාගාදී කෙලෙස් මතු නූපදනා පරිද්දෙන් නැසූ

හෙයින්ද, ... දිව්‍ය, මනුෂ්‍යාදීන් විසින් කරනු ලබන සියළුම පූජාවන් ලැබීමට සුදුසු හෙයින්ද, රහසින්වත් පව් නොකරන හෙයින්ද, අරහං නම් වන සේක. **(Worthy of having any offerings even from Gods).**

මෙම ගුණය පළමු කොටම අප විසින් මනාසේ අවබෝධ කටයුතුමය. මෙම අරහං යන පදය ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි (in Oxford Dictionary)- person of some distinction in his...characteristic /estimable of deserving respect) යනුවෙන් අර්ථ විග්‍රහයක් ගෙන හැර පා ඇත. මෙම අරහං ගුණය අති ගෞරවණීයත්වයට පාත්‍ර විය යුතු, බුද්ධත්වයට පමණක් සීමා වූ සුවිශේෂී සුදුසුකමකි. තුන් ලෝකාග්‍ර වූ උන්වහන්සේ මනුෂ්‍ය ලෝක පමණක් නොව දිව්‍ය බ්‍රහ්ම ලෝක වලින් පවා පූජාවන් ලැබීමට හිමි කරගත්තා වූ මෙම සුදුසුකම අති ශ්‍රේෂ්ඨ වන අතර වෙනත් කිසිදු වදනකට එම අරහං ගුණය සමකළ නොහැක්කේමය.

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ පරෝප දේශ රහිතව තමන් වහන්සේ විසින්ම චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීම සහ එම තුන් කල්හිම බලපවත්නා සියලු ධර්මතාවයන් සකල ලෝ වැස්සන්ගේ යහපත පිණිස දෙව් මිනිස් සැමට අවබෝධ කරවීම නිසා සම්මා සම්බුද්ධ නම් වන සේක. **(Perfectly Enlightened; Philosophy of reason and individualism)**

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සතර සංවර සීලයෙන් යුතුව, (විදර්ශනා ඥානය, මනෝමය ඍද්ධි ඥානය, දිව්‍ය ශෝත ඥානය ඍද්ධිවිධ ඥානය, පරචිත්ත විජානන ඥානටය, පූර්වේ නිවාසානුස්මෘති ඥානය, දිව්‍ය චක්ෂුරභ ඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය, යන අෂ්ඨ විද්‍යාවෙන් සහ ප්‍රාතිමෝක්‍ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, භෝජනයේ පමණ දැනගැනීම, භාවනා කටයුතු සඳහා නිදි වර්ජිතව සිටීම, ශ්‍රද්ධාව, හිරිය, ඔත්තප්පය, බහුශ්‍රැත බව, වීර්යය, සතිය, කුසල සම්ප්‍රයුක්ත ප්‍රඥාව, ආකාසනාඤ්ඤායතනය, ආකිඤ්චඤ්ඤායතනය, විඤ්ඤාණඤ්චායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන පසළොස්චරණ ධර්මයෙන් සමන්නාගත හෙයින්, විජ්ජාචරණ සම්පන්න නම් වන සේක. **(Endowed with knowledge and Conduct)**

තථාගතයන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින්, ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ නිවන නම් වූ පැහැදිලි ගමනාන්තය කරා සන්සුන් ගමනින් වැඩි හෙයින් සුගත නම් වන සේක. **(Walked along the correct path having a clear destination)**

දිව්‍ය ලෝක 6, මනුෂ්‍ය ලෝකය, අපාය 4, රූපාවචර බ්‍රහ්ම ලෝක 16, අරූපාවචර බ්‍රහ්ම ලෝක 4 වශයෙන් සලකා බලන කල භූමි 31 කින් සමන්විත මුළු සක්වලෙහිම පැවැත්ම පිළිබඳව එනම් සත්ව, සංස්කාර සහ අවකාශ යන ලෝකත්‍රය පිළිබඳව නිරවශේෂයෙන් දැන වදාළ බැවින් ලෝක විදූ නම් වන සේක. **(Well-gone knower of the world)**

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට දිව්‍ය මනුෂ්‍යාදී ලෝක වල ශීල, සමාධි ප්‍රඥාදියෙන් සම කෙනෙක් නොමැති හෙයින් සහ දමනය කර ගැනීමට අසීරු වූ ඕනෑම දරුණු මිනිසෙකු, සත්වයෙකු, රකුසෙකු මෛත්‍රී බලයෙන් දමනය කළ හෙයින් අනුත්තරෝ පුරිස දම්ම සාරථී නම් වන සේක. **(Supreme trainer of persons to be tamed).**

තථාගතයන් වහන්සේ දෙව් මිනිස් සැමගේ සනාතන ශාස්තෘ වරයාණන් වූ සේක. යහපත් ලෞකික ජීවිත ගතකිරීමට මඟ පාදා දුන් උන් වහන්සේ පරලොව සුගතිගාමී කරගැනීමට අවශ්‍ය උපදෙස් මෙන්ම සියලු දුක් නැති කරගැනීම සඳහා නිවන් මඟ ද පහදා දුනි. මෙම 7 වන බුදුගුණය සත්ථා දේව මනුස්සානං නම් වන සේක. **(The teacher of Gods & men)**

මීළඟට බුද්ධ යන අති පාරිශුද්ධ වූ 8 වන බුදු ගුණය කෙරෙහි අවධානය යොමු විය යුතුය. ඉංග්‍රීසි බසින් (Enlightment) යනුවෙන් හඳුන්වනු ලබන මෙම ශ්‍රේෂ්ඨත්වය (Philosophy of reason and individualism) යනුවෙන් Oxford Dictionary හි අර්ථ විග්‍රහය අනුව පැහැදිලිය. මෙම චින්තනය, සියලු මිත්‍යා මත වලින් තොර වූ ගැඹුරු අවබෝධයක් මෙන්ම ඉතාමත් නිර්මල වූ පූජණීත්වයට පත්වූ මනාව පසක් කර ගත්තා වූ හේතු ඵල ධර්මතාවය මත පදනම් වූ යථාවබෝධයක්ම වන්නේය. තුන් ලෝකයෙහිම යථාර්ථය මෙලෙසින් දැක චතුරාර්ය සත්‍ය තමා විසින්ම අවබෝධ කරගනිමින් සර්වඥතාඥානය ලබා අන් අයටද අවබෝධ කළ හෙයින් 'බුද්ධ' නම් වන සේක.

මීළඟට භගවා යන අති පාරිශුද්ධ වූ 8 වන බුදු ගුණය කෙරෙහි අවධානය යොමු විය යුතුය

විවිධ ශබ්දකෝෂයන්හි අර්ථ දැක්වීම්වලට අනුව පින්වත්, පූජාර්හ, භාග්‍ය වෙත් ඓශ්චර්ය, වීර්යය යසශ්‍රී ආදී ගුණයන්ගෙන් යුත්, යනාදී වශයෙන් අරුත් ගෙන හැර දක්වා ඇති නමුත්,

භග්ගරාගො භග්ගදොසා - භග්ගමොගො අණාසවො
භග්ගාසස්ස පාපකා ධම්මා - භගවා තෙන වුච්චති

යන ගාථාවට අනුව ඊෂ්වර යන අරුත් දෙයි. මෙම භාග්‍යය පෙර පින හෙවත් දෛවය යනුවෙන්ද ශබ්ද කෝෂයෙහි අරුත් දක්වා ඇත. සියලු කෙලෙස් මුලිනුපුටා දැමූ හෙයින්ද, සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් සේවනය කර වදාළ බැවින්ද, සසර ගමන සිඳලූ හෙයින් ද, නාම-රූප ධර්මයන් විශ්ලේෂණය කොට දහම් දෙසූ හෙයින්ද භගවා නම් වන බව පැහැදිලිය. ලොව පහළවන්නා වූ බුදුවරුන්ට තිබෙන්නා වූ මෙම භාග්‍යය 6 ආකාරයකින් සවිස්තරව දැක්වේ. එනම් ඓශ්චර්ය භාග්‍යය, යස භාග්‍යය, ශ්‍රී භාග්‍යය, ධර්ම භාග්‍යය, කාම භාග්‍යය සහ ප්‍රයත්න භාග්‍යයයි.

ඓශ්චර භාග්‍යය

ඕනෑම පුද්ගලයෙක් හෝ ඕනෑම වස්තුවක් සිතැඟි පරිදි මෙහෙයවීමටත්, දෙවියන්ගේ සැක දුරු කිරීමටත් සහ නැදෑයින්ගේ මානය නැති කිරීමට තෙවරක් යමා මහ පෙළහර පෑමටත්, භාග්‍ය සම්පන්න වූ බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සමවැදී ලෝකය දෙස බලා සරණ විය යුතු අයට පිහිට වීමටත්, අටලෝ දහම අවබෝධ කර දීමටත්, නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය පහදා දීමටත්, මුළු මහත් තුන් ලොවට ශ්‍රේෂ්ඨ වීමටත්, අධිපති වීමට හැකි වූයේ මේ මහා ඓශ්චර්ය භාග්‍යය නිසා බව ධර්මයේ සඳහන්ය.

යස භාග්‍යය

කීර්තිය, සම්පත, ශූර භාවය, ප්‍රසාදය ආදී අරුත් දෙන මීළඟ භාග්‍යය යස භාග්‍යයයි. සැමට එක ලෙස මහා කරුණා ගුණයෙන් යුතුව පටාචාරා, කිසාගෝතමී වැනි නිවන් දැකීමට හේතු සම්පත් ඇත්තවුන් නිවන් මඟට යොමු කරවීමටත්, දිව්‍ය බ්‍රහ්ම

අසඛ්‍යදතලයන්හි පවා සිල් සුවඳ හා ප්‍රඥා බලය විහිදුවාලීමට හැකි වූයේ මෙම මහා යස භාග්‍ය බුදුරජාණන් වහන්සේ සතු වූ හෙයිනි.

<u>ශ්‍රී භාග්‍යය</u>

නෙත, ගත, සිත නිවෙන රූප ශෝභාවක් ලැබීමට හේතු වූ මීළඟ භාග්‍යය ශ්‍රී භාග්‍යයයි. වක්කලී භික්ෂුව බුදුරජාණන් වහන්සේ දෙසම බලා සිටීමට පෙළඹුණ ආකාරයත්, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබි බුදුරජාණන් වහන්සේගේ රූප ශෝභාව යශෝධරා දේවිය විස්තර කළ ආකාරයත් (නරසීහ ගාථා) උන් වහන්සේ ගේ ශ්‍රී භාග්‍යය මනාව පිළිඹිබු කරයි.

<u>ධර්ම භාග්‍යය</u>

මිථ්‍යා දෘෂ්ඨික අයෙකු වුවද, බුදු සමිඳු අසලට පැමිණියේ නම් එතනින් පිටව ගියේ ධර්මලාභය ලබා සම්‍යක් දෘෂ්ඨිකයෙකු ලෙසිනි. රූප නන්දාවගේ කථාවෙහි රූපයට නිග්‍රහ කරන බව කියමින් බුදුරජාණන් වහන්සේ අබියසට නොපැමිණි රූප නන්දා බිසව, ධර්මය ශ්‍රවණය කිරීමෙන් ධර්මයේ හඬට පැහැදී රූපය දැකීමේ ආශාවක් ඉපිද බුදු සමිඳු අබියසට පැමිණි ආකාරය බෞද්ධ ඉතිහාසයේ සඳහන් වෙයි. බුදුරජාණන් වහන්සේ මැයගේ මානය දුරු කිරීම පිණිස, රූප ශෝභාවෙන් පරිපූර්ණ පවන් සලන කාන්තාවන් මවා, ඔවුන් ක්‍රමයෙන් වැඩිහිටි, මහලු, දුර්වල බවට පත්කොට පෙන්වා, අවසානයේදී ඇට සැකිල්ලක් බවට පත් කොට රූප නන්දාවට දක්නට සැලැස්වූ සේක. පෙර පින් මෝරා තිබූ රූප නන්දාව එම ඇට සැකිළි දුටු පමණින් සෝවාන් බවට පිළිපන් බව ධර්මයේ සඳහන්ය. ඇට කැබලි 300 කින්, නහර 900 කින් සහ මස්පිඩු 900 කින් සමන්විත, ඕජස් පිරුණු මෙම ශරීරය බඳුනකට සමකර පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ සිය ධර්ම භාග්‍යයෙන් රූප මානය බිඳ දැමූ සේක.

<u>කාම භාග්‍යය</u>

කාම භාග්‍යය යනු කැමැත්ත හෙවත් ආශාවයි. ලෝ සතුන් සසර දුකින් මුදවා ගැනීමේ ආශාවයි. අනුන්ට උදව් උපකාර කිරීමේ කැමැත්තයි. දවසේ පැය 24, අදියර 5 කට බෙදා වෙන් කරගත් බුදුරජාණන් වහන්සේ පැය 16 ක් මිනිසුන් වෙනුවෙනුත්, පැය 4 ක් දිව්‍ය

ලෝක, බ්‍රහ්ම ලෝක සහ නාග ලෝකවල සිටින අය සඳහාත්, පැය 4 අමනුෂ්‍යයන් සඳහාත් වෙන්කර පැය 2 ක් පමණක් විවේකී සුවය සඳහා යොදා ගෙන, පැය 22 ක්ම ලෝ වැස්සන් ගේ යහපත පිණිස ම කටයුතු කළේ **කාම භාග්‍යය** උන් වහන්සේ සතුව පැවති හෙයිනි.

<u>ප්‍රයත්න භාග්‍යය</u>

යම් කටයුත්තක් ආරම්භ කිරීමත් (ආරම්භක ධාතු), ආරම්භක කාර්යය දිගටම කර ගෙන යාමත් **(නික්ඛම ධාතු)** අරමුණ ඉෂ්ඨ වනතුරු සම්බාධක අභිබවා දෘඪතර අධිෂ්ඨානයෙන් යුතුව කරගෙන යාමත් **(පරක්ඛම ධාතු)** ප්‍රයත්න භාග්‍යයේ ලක්ෂණය වන අතර, ආපසු හැරී බලන විට පැමිණි සියලු බාධක වෙස් වලාගත් ආශිර්වාද මෙන් දිස්වනු ඇත.

මෙවන් අප්‍රමාණ වූ ගුණස්කන්ධයකින් හෙබි බුදුරජාණන් වහන්සේට සම කළ හැකි රත්නයක් කිසිම ලොවක නොමැති බව **ඒකාන්ත සත්‍යයකි.** උන් වහන්සේ විසින් ම අවබෝධ කරගත් ශ්‍රී ධර්මය සකළ ලෝකවාසීන් කෙරෙහි පතල වූ මහා කරුණාවෙන් යුතුව මැනවින් දේශනා කරන ලද බව ද **පරම සත්‍යයකි.**

☸ ☸ ☸

එම නව ලෝකෝත්තර ධර්මය සහ පර්යාප්ති ධර්මය ශ්‍රේෂ්ඨ ගුණාංග හයකින් සමන්විතය. මෙවන් ගුණස්කන්ධයකින් හෙබි ඒ නිර්වාන ධර්මය ද ලොව බබළවන්නා වූ රත්නයක් බව ද සත්‍යයකි.

භාග්‍යවතුන් වහන්සේ විසින් එම ශ්‍රී සද්ධර්මය මුල, මැද, අග මනාකොට දේශනා කර ඇති බැවින් **ස්වාක්ඛාතය.** (Well expounded from beginning to the end.) එම ලෝකෝත්තර ධර්මය තම සන්තානයෙහි රාගාදීන් දුරු කොට තමා විසින්ම දැකිය යුතු බැවින් **සන්දිට්ඨිකය.** (Can be seen) කිසියම් කාල පරාසයකට සීමා නොවී කල් නොයවාම විපාක ලැබිය හැකි බැවින් **අකාලිකය.** (not limited for a certain period). එව, බලවයි දැක්විය හැකි විපාක ඇති හෙයින් ධර්මය **ඒහි පස්සිකය.** (It is existed and can be seen) ශ්‍රද්ධා සම්පන්නව ලොව පවත්නා ධර්මයට අවතීර්ණ වන අයෙකුට එය ගෝචර වෙයි.

ඕපනයික ගුණයෙන් අවබෝධ කරගත් ධර්මය සිත් තුළ රඳවා තබාගත හැකි සහ ඒ ඔස්සේ ඉදිරියට යා හැකි බව පෙන්නුම් කරයි. (Leading onwards) යනුවෙන් ඉංග්‍රීසි බසින් මෙය අර්ථ දක්වා ඇත්තේ එසේ ඉදිරියට යාමට මඟපෙන්විය හැකි බලයක් ධර්මය තුළම ගැබ්ව ඇති හෙයිනි.

ඉහත කී ගුණයන්ගෙන් සමන්විත ශ්‍රී සද්ධර්මයේ සය වන ගුණය **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති** යනුවෙන් දැක්වේ. ඉංග්‍රීසි බසින් (to be personally realized by the wise) ලෙස අර්ථය ගෙන හැර පා ඇත්තේ, ධර්මය අවබෝධ කර ගැනීමේ සහ එහි හරය ජීවිතයට ගලපා ගැනීමේ ප්‍රවණතාව එක් එක් පුද්ගලයාගේ ප්‍රඥාවට සාපේක්ෂ වන හෙයිනි.

☸ ☸ ☸

මීළඟට **ශ්‍රාවක සංඝ රත්නයේ** ගුණස්කන්ධ ය විමසිලිමත් නුවණින් දැකිය යුතුමය. ප්‍රතිපත්ති ධර්මයට අවතීර්ණව ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ සන්සුන්ව යහපත් ප්‍රතිපත්ති වඩන හෙයින් එම සංඝ රත්නය **සුපටිපන්න** (enter the True path and practice) වන බව අවබෝධ කටයුතුය. එම ප්‍රතිපත්ති අවංකව මෙන්ම සෘජුව ආරක්ෂා කිරීමේ ගුණය **උජුපටිපන්න** (enter the straight path and practice) නම් වෙයි. නිර්වාන මාර්ගයේ ප්‍රතිපත්ති පුරන **ඤායපටිපන්න** (enter the correct path and practice) ගුණයද සංඝයා වහන්සේ සතුය. ගෞරවයට පාත්‍ර විය යුතු යහපත් ප්‍රතිපත්ති පිරීම නිසා සිව්පස ලැබීමට සුදුසු වීම **සාමීචිපටිපන්න** (enter the proper path and practice) ගුණය යි. ධර්මානු ධර්ම ප්‍රතිපත්ති නිසි ලෙස පුරමින් සෝවාන් මාර්ගයට ප්‍රවිෂ්ඨ වීමට වීර්ය කරන පුද්ගලයාගේ පටන් සතර මඟ සතර ඵල ලබමින් අර්හත් ඵලය ලබා ගැනීම දක්වා වූ අදියර 8 සිටින හෙයින් **යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා** යනුවෙන් දැක්වෙයි.

මෙම අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නය **ආහුණෙය්‍ය** ගුණයෙන් (worthy of offerings) යුක්තය. එනම් දුර සිට වුවද ගෙන එන්නා වූ සිව් පස පිළිගැනීමට සුදුසු වීමයි. **පාහුණෙය්‍ය** ගුණයෙන් (Worthy of hospitality) අදහස් වන්නේ විශේෂයෙන් සකස් කරනු ලැබූ ආහාර පාන වුවද පිළිගැනීමට සුදුසු බව යි **දක්ඛිණෙය්‍ය** (worthy of

offering alms which was prepared on behalf of departed ones) යනුවෙන් අදහස් කෙරෙනුයේ මිය ගිය අය වෙනුවෙන් දෙන දානයක් මෙන්ම පරලොව සැප පතා දෙන දානයක් වුවද පිළිගැනීමට සංඝ රත්නය සුදුසු බවයි. **අඤ්ජලීකරණය** (worthy of having respectful salutation performed by raising up joined hands) යනු යහපත් වූ ප්‍රතිපත්ති නිරතුරුවම වඩන හෙයින් දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසු බව යි. මෙම සියලු ගුණාංගයන්ගෙන් යුත් සංඝ රත්නය පිං නම් වූ සාරවත් අස්වැන්න ලබා ගත හැකි කෙතකට උපමා කර ඇති හෙයින් **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං** (field of merits) නම් වෙයි.

භවගාමීව දුක් විඳින ලෝ සතුනට නිවන් සැප ළඟා කරගැනීම සඳහා පවතින පිං කෙතක් බඳු වූ ආර්යයන් වහන්සේ, දක්ෂිණාව යන කර්ම ඵල අදහාගෙන දෙනු ලබන දන් ලැබීමට සුදුස්සෝය. **(දක්ඛිණෙය්‍යා)** සුගත වූ තථාගතයින් වහන්සේගේ ශ්‍රාවකයෝය. **(සුගතස්ස සාවකා)**. අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නය වෙත දන් පිරිනැමීම මහත්ඵලය **(ඒතෙසු දින්නානි මහප්ඵලානි)**. අට්ඨ කථාවෙහි ආර්ය පුද්ගලයින් 108 දෙනෙකු වශයෙන් දක්වා ඇත. **(යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා)** ඔවුන් සතු ගුණස්කන්ධය අපරිමිතය.

☸ ☸ ☸

බුද්ධ, ධම්ම සංඝ නම් වූ මෙම උතුම් තෙරුවන මහා ජයමංගල ගාථාවන්හි (The Great Verses of Joyous Victory) පෙන්වා දී ඇති අන්දමට වජ්‍ර මාණික්‍යයකි. ලොව විවිධාකාර වටිනා මැණික් වර්ග කොතෙක් බහුලව තිබුණ ද බුද්ධ, ධම්ම සංඝ නම් වූ උතුම් ත්‍රිවිධ රත්නයට සම කළ හැකි මාණික්‍යයක් නොවන්නේමය

යං කිඤ්චි රතනං ලෝකෙ - විජ්ජති විවිධාපුතු
රතනං බුද්ධ සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

What ever jewels may exist in the world, abundant and varied There is no jewel equal to Buddha- **By this truth May I be secured.**

යං කිඤ්චි රතනං ලෝකෙ - විජ්ජති විවිධාපුථු
රතනං ධම්ම සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

Whatever jewels may exist in the world,abundant and varied There is no jewel equal to Dhamma-**By this truth May I be secured.**

යං කිංචි රතනං ලෝකෙ - විජ්ජති විවිධාපුථු
රතනං සංඝ සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

Whatever jewels may exist in the world,abundant and varied There is no jewel equal to Sangha- By this truth May I be secured.

ත්‍රිවිධ රත්නයේ බලයෙන් ලබන්නා වූ පිහිට, ආරක්ෂාව වෙනත් කිසිම බලවේගයක් මගින් විනාශ කර දැමිය නොහැක්කේ, ඉහත ගාථා රත්නයන්ගෙන් ධ්වනිතාර්ථ වූ පරිදි සියලුම මැණික් වර්ග කපා ඔපමට්ටම් කිරීමේ බලයක් වජ්‍ර මාණික්‍ය සතු වන්නාසේමය.

☸ ☸ ☸

රතන සූත්‍රය තුළින් විනිවිද දැකිය හැකි සත්‍ය වූ ආර්ග ගුණ සංක්ෂිප්තව මෙසේය.

1. තථාගත බුදුරජාණන් වහන්සේට සම කළ හැකි කිසිදු රත්නයක් ලොව කිසිදු තැනක නැත. උන් වහන්සේ උත්තරීතරය. අසම සමය. දෙව්, මිනිස් බ්‍රහ්ම ආදී සැමගේ සියළුම පූජාවන් ලැබීම සඳහා සුදුසුය. මෙම ශ්‍රේෂ්ඨ ගුණය පරම සත්‍යයකි.

2. උන් වහන්සේ විසින් අවබෝධ කොටගත්, කෙලෙස් නසන්නා වූ, කෙලෙසුන්ගෙන් තුරන් වූ උතුම් නිර්වාන ධර්මය හා සමාන වූ කිසිවක් ලොව නැත. මෙම සුවිශේෂී ගුණය ඒකාන්ත සත්‍යයකි.

3. සංඝ රත්නය කෙරෙහි පවතින්නා වූ සෝවාන් ආදී මාර්ග සමාධිය හා සම වූවක් නැත. මාර්ග ධර්මයේ මෙම ගුණස්කන්ධය සත්‍යයකි.

4. සෝවාන්, සකෘදාගාමී අනාගාමී සහ අර්හත් යන යුගල 4 ට

අයත් බුද්ධශ්‍රාවකයින් වහන්සේලා පුද ලැබීමට සුදුසුය. ඔවුන් වෙත පුදනු ලබන දානය මහත් ඵලය. සංඝ රත්නයේ මෙම ආර්ය ගුණය පරම සත්‍යයකි.

5. සීල සමාධි ගුණ වඩවා, සමාධියෙන් දැඩි වූ සිත් ඇතිව කෙලෙසුන්ගෙන් තුරන්ව රහත් ඵලයට පත් සංඝ රත්නය මෙම අමිල වූ නිවන් සැපය වළඳයි. සංඝයා කෙරෙහි පවතින මෙම ගුණය හෙවත් උතුම් රත්න භාවය සත්‍යයකි.

6. සතර දිගින් හමන සුළඟට නොසෙල්වෙන කණුවක් සේ, ආර්ය සත්‍යයන් අවබෝධ කොට ගත් උතුම් පුරුෂයා අකම්පිතය. සෝවාන් වූ සංඝයා කෙරෙහි පවතින මෙම උතුම් ආර්ය ගුණය ද ඒකාන්ත. සත්‍යයකි..

7. සෝවාන් වූ සංඝ රත්නය අතින් සුළු හෝ පාපයක් සිදු වූයේ ද, සත්‍ය වශයෙන්ම එය කිසිවිටක නොසඟවයි. මෙම ගුණයද උතුම් රත්න භාවයේ ලක්‍ෂණයකි.

8. නිවන් පසක් කර දෙන මෙම උතුම් ධර්මය ලෝ සතුන්ගේ හිත සුව පිණිස බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. මෙය බුද්ධ රත්නය කෙරෙහි පවතින්නා වූ සත්‍ය වූ ශ්‍රේෂ්ඨ බුදු ගුණයකි.

9. සෝවාන් තත්ත්වයට පත් ආර්යයන් වහන්සේ නිර්වානය අවබෝධ කරගැනීම සඳහා කිසියම් ප්‍රමාදයක් වුවද, අට වෙනි භවයක් කරා නොයයි. මෙම ගුණයද ආර්යයන් වහන්සේ කෙරෙහි පවතින්නා වූ පරම සත්‍යයකි.

10. පුරාණ කර්ම ගෙවී ගිය, අළුත් කර්ම හටගැනීමක් නැති, භවයෙනි නොඇළුණ සිත් ඇති ධෛර්යවත් වූ, නැවත ඉපදීම ක්‍ෂය කළ රහතන් වහන්සේලා පහන මෙන් නිවී යයි. මෙය ඔවුන්ගේ අනුපාදිශේෂ පරිනිර්වාණ ගුණයයි. සංඝයා කෙරෙහි පවතින මෙම උතුම් රත්නභාවය සත්‍යයකි...

(6)

අනුපමේය රත්නය
Unique Treasure

බුද්ධ, ධර්ම සංඝ යන ත්‍රිවිධ රත්නය මහානුබල සම්පන්නය. රත්නය වූ කලී වටිනා වස්තුවකි. බුද්ධ, ධර්ම සංඝ යන රත්නත්‍රය රත්න භාවයට පත්වන ආකාරය දෙස විමර්ශනාත්මකව බැලිය යුතුමය.

චිත්තීකතං මහග්ඝංච - අතුලං දුල්ලභ දස්සනං
අනෝම සත්ත පරිභෝගං - රතනංති පවුච්චති

අනුපමේය වටිනා කමකින් යුත්, දැකීම අතිශය දුෂ්කර වූ, කිසිවකට සම කළ නොහැකි, සිතු පැතු සම්පත් ලබා දෙන යමක් වේ නම් එය රත්නයකි. බුද්ධ, ධම්ම සංඝ යන වචනත්‍රය ඒකරාශීව සැදුම්ලත් රත්නත්‍රය එකී සියලුම ගුණාංග වලින් සමන්විත වූයෙන් මහා බල සම්පන්නය.

තුන්ලෝකාග්‍ර සම්මා සම්බුදුරජාණන් වහන්සේ බුද්ධ රත්නයයි. උන් වහන්සේ වදාළ සුවාසූ දහසක් ධර්මස්කන්ධය ධම්ම රත්නයයි. තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයන් බවට පැමිණි අෂ්ටාර්ය පුද්ගල මහා සංඝයා වහන්සේ සංඝ රත්නයයි.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර ලොව පහළ වූ දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයෙහිදී අප මහ බෝසතාණන් වහන්සේ සුමේධ නම් තවුසෙක්ව ඉපිද නියත විවරණ ලැබ, එතැන පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දානාදී දශ පාරමී, දශ උප පාරමී, සහ දස පරමත්ත පාරමී ධර්මයන් සම්පූර්ණ කොට මේ අත් භවයේදී, දඹදිව් තලයෙහි ශාක්‍ය වංශයෙහි සුද්ධෝදන රජතුමාට දාව මහාමායා දේවියගේ කුසින් බිහිව සිද්ධාර්ථ නම් කුමරෙකු ලෙසින් 29 විය දක්වා කාම සුඛල්ලිකානු යෝගයෙන් දිවි ගෙවා එහි කළකිරී, ගිහි ගෙය අතහැර සය අවුරුද්දක් අත්තකිලමතානු යෝගයෙහි යෙදී එය ද හර ශූන්‍ය බව අවබෝධ කොටගෙන මධ්‍යම ප්‍රතිපදාවට පැමිණ, වෙසක්පුර පසළොස්වක දින මාර සේනාව පරාජය කොට **ද්වාත්‍රිංශද්වර මහා පුරුෂ ලක්ෂණ - අශීත්‍යනුව්‍යඤ්ජන - කේතුමාලාලංකාරාදී** වූ අපරිමිත රූපකාය සම්පත්තියෙන්ද දශබල

වෛශාරද්‍යාදී අනේතක විධ ඥානකාය සම්පත්තියෙන් ද, සකළ ලෝක ධාතුවෙහි පවත්නා සර්ව ධර්මයන් සර්වාකාරයෙන්ම ස්වයංභූත ඥානයෙන් අවබෝධකොට උත්තම සම්‍යක් සම්බුද්ධත්වය අවබෝධ කළ සේක. මුළු ලෝකයෙහිම සකළ සත්ත්වයන්ට සර්වාකාරයෙන් ශ්‍රේෂ්ඨත්වයට පැමිණි හෙයින් ඒ උතුමාණන් වහන්සේ බුද්ධ රත්නය නම් වන සේක.

තමන් වහන්සේ විසින් අවබෝධ කොටගත් චතුරාර්ය සත්‍ය මත පදනම් වූ සුවාසූ දහසක් ධර්මස්කන්ධය සූත්‍ර, අභිධර්ම, විනය යන ත්‍රිපිටකයට අන්තර්ගතකර භවගාමී සකල ලෝක සත්ත්වයින් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව ඔවුන්ගේ දුක්ඛස්කන්ධය කෙළවර කර නිර්වාණ සැපත සාක්‍ෂාත් කරනු සඳහා දේශනා කර වදාළ, සමථ විදර්ශනා භාවනා ඔස්සේ සිත වඩවාගත් යෝගාවචරයා විසින් සාක්‍ෂාත් කරගත හැකි සෝතාපත්ති මාර්ග-ඵල, සකෘදාගාමී මාර්ග-ඵල, අනාගාමී මාර්ග-ඵල, අර්හත් මාර්ග ඵල සහ උතුම් නිර්වානය යන නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ධර්ම රත්නය නම් වන සේක.

සකල ලෝ වැසියන්ගේ කෙලෙස් දුරු කර ගැනීම සඳහා දේශනා කර වදාළ දාන, සීල, ස්වර්ග කථාවන්ද, කාමයන්ගෙන් හටගන්නා දෝෂ ද, කාමයන්ගේ ඇති පහත් බවද, කෙලෙසීම ද, නෛෂ්ක්‍රම්‍යයේ (renunciation) ඇති අනුසස් ද අසා ගිහිගෙයි කළකිරී පැවිදිව සමථ විදර්ශනා වඩා සතර මඟ සතර ඵලයට පැමිණි සැරියුත් මුගලන් අග සව්වන්ගෙන් පටන් පැවත එන ශ්‍රාවක සමූහයා සංඝ රත්නය නම් වන සේක

මෙහිදී තුන්ලෝකාග්‍ර බුදු රජාණන් වහන්සේ බුද්ධ - රත්නය බවට පත්වන අයුරු වඩාත් පැහැදිලිව අවබෝධ කටයුතුමය.

'රත්න' යන්න අවිඤ්ඤාණක සහ සවිඤ්ඤාණක වශයෙන් දෙකකි. රන් රුවන් ආදී සිත් නැති රත්න අවිඤ්ඤාණක වන අතර සවිඤ්ඤාණක යනු සිත් ඇති රත්න යි. මෙයින් වඩාත් ශ්‍රේෂ්ඨ වන්නේ සවිඤ්ඤාණක රත්නය යි. එයද තිරස්චීන සහ මනුෂ්‍ය වශයෙන් බෙදී යයි. තිරස්චීන රත්නයට හස්ති අශ්ව ආදී රත්න

සැලකෙන අතර මනුෂ්‍ය රත්නය මෙහිදී ශ්‍රේෂ්ඨ වෙයි. එයද ස්ත්‍රී රත්නය, පුරුෂ රත්නය ආදී වශයෙන් බෙදී යයි. චක්‍රවර්ති රජවරුන්ට අග්‍ර මෙහේසිකාවන් ලෙස ස්ත්‍රී රත්නය වටී. එහෙත් මෙහිදී ද ශ්‍රේෂ්ඨ වන්නේ පුරුෂ රත්නයයි. එයද අගාරික, අනගාරික වශයෙන් බෙදී යයි. අගාරික පුරුෂයා ගිහි ගෙයි වෙසෙමින් අඹු දරුවන් රකී. අනගාරික පුද්ගලයා පැවිදි බවට පත් වෙයි. එයින් වඩා ශ්‍රේෂ්ඨ වන පැවිදි රත්නය ශ්‍රාවක සහ බුද්ධ රත්නය වශයෙන් කොටස් දෙකකට බෙදෙයි. එයින් වඩා ශ්‍රේෂ්ඨ වන්නේ බුද්ධ රත්නයයි. එයද පච්චේක බුද්ධ සහ සම්මා සම්බුද්ධ යනුවෙන් බෙදී යයි. එයින්ද වඩාත් ශ්‍රේෂ්ඨ වන්නේ සම්මා සම්බුද්ධ රත්නයයි.

එබැවින් තුන් ලොවෙහිම ඇති අවිඤ්ඤාණක සහ සවිඤ්ඤාණක සෑම රත්නයක් අතුරෙන්ම තුන් ලෝකාග්‍ර වූ සම්මා සම්බුද්ධ රත්නය අග්‍ර, ශ්‍රේෂ්ඨ උත්තම රත්නය බවට පත් වෙයි. ඒ උත්තමයාණන් වහන්සේ සීල, සමාධි ප්‍රඥා ආදියෙන් ද, විමුක්තියෙන් ද, විමුක්ති ඥාන දර්ශනයෙන් ද, දේශනා විලාශයෙන් ද අගනාප්පත්ය. මෙය ඒකාන්ත සත්‍යයකි. ඒ අති උතුම් අසහාය අනුපමේය ගුණස්කන්ධයකින් යුත් බුදු රජාණන් වහන්සේගේ ගුණානුභාවයෙන් දෙවියන් සහිත ලෝකයට සෙත් වේවා! යන්න 'යං කිංචි චිත්තං ඉධවා හුරංවා' යන ගාථාවෙන් මතුකොට දක්වන ශ්‍රේෂ්ඨතම අර්ථයයි.

මීළඟට තුන්ලෝකාග්‍ර වූ බුදු රජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය ද ධර්ම - රත්නය බවට පත්වන අයුරු වඩාත් පැහැදිලිව අවබෝධ කටයුතුවය.

තථාගතයන් වහන්සේ අවබෝධ කළ මෙම ශාන්ත රත්නය, නිර්වාණ ධර්මය හා සමාන සත්‍යයක් තුන් ලොවෙහිම නැත. රාගයෙන් වෙන්වී (විරාග) දුක් සියල්ලම ක්ෂය කෙරෙන මෙම ධර්මය අමෘතයක් බඳුයි. (අමතං) ප්‍රණීත දෙයක් (පණීතං). මෙය ද ඒකාන්ත සත්‍යයකි. මෙම සත්‍යානුභාවයෙන් සකල ලෝ වැසියනට සෙත් පැතීම - ඛයං විරාගං අමතං පණීතං ගාථාවේ අදහසයි. මෙම ශ්‍රේෂ්ඨ ධර්මය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කළ බව පරම සත්‍යයකි. චතුරාර්ය සත්‍ය මත පදනම්ව ත්‍රිපිටකයට අන්තර්ගත වූ සුවාසූ දහසක ධර්මස්කන්ධය සතර මාර්ග සතර ඵල සහ නිර්වාණය යන නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයට සම කළ හැකි උතුම් ශ්‍රේෂ්ඨ දහමක්

දේශනා කල ස්ථානයක් හෝ දේශනා කළ පුද්ගලයෙකු තුන් ලොවෙහිම නැත. එබැවින් මෙම නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ධර්ම රත්නය බවට පත්වෙයි.

මීළඟට බුද්ධ ශ්‍රාවක අෂ්ඨ ආර්ය සංඝයා - සංඝ රත්නය බවට පත්වන අයුරු ද අවබෝධ කටයුතුමය.

සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ගස්ථ ඵලස්ථ යනුවෙන් යුගල 4 ක් වූ ආර්ය පුද්ගලයන් 8 දෙනා සුගත වූ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝය. (සුගතස්ස සාවකා). දක්ෂිණාව යන කර්ම ඵල අදහා ගෙන දෙනු ලබන දන් ලැබීමට සුදුස්සෝය. (**තෙදක්ඛිණෙය්‍යා**) දන් පූජා කිරීමෙන් මහත්ඵල ලබාගත හැක. මෙම ආර්ය පුද්ගලයන් **''ඒක බීජ, කෝලංකෝල සහ සත්තක්ඛත්තුපරම''** වශයෙන් සෝතාපන්න පුද්ගලයන් තිදෙනෙකු සේ සැලකෙයි. මතු එක් උත්පත්තියකින් පමණක් සංසා ගමන නිමවා පිරිනිවන් පානා සෝවාන් පුද්ගලයා **''ඒක බීජ''**. ලෙසටත්, ආත්ම භාව 7ක් අතර සංඛ්‍යාවක් සසර සැරිසරා නිවන් දක්නා සෝවාන් තැනැත්තා **කෝලං කෝල** ලෙසටත් උපරිම ආත්මභව හතක් පමණ සසර සැරිසරා නිවන් දක්නා සොවාන් තැනැත්තා **සත්තක්ඛත්තුපරම** ලෙසටත් අට්ඨ කථාවෙහි සඳහන් වෙයි. මෙම ආර්ය පුද්ගල මහා සංඝ රත්නය පුණ්‍යක්ෂෙත්‍රයකි. උන් වහන්සේලාට දන් දීමෙන් මහත් ඵල ලැබේ. මෙයද පරම සත්‍යයකි. මෙම ශ්‍රේෂ්ඨත්වය නිසා ආර්ය සංඝයා ද **සංඝ - රත්නය** බවට පත්වෙයි.

(7) භාවිතයෙන් ලද හැකි ඵල
Vivid result of utilization

උදේ සවස දෛනිකව රතන සූත්‍රය සජ්ඣායනා කිරීමට පුරුදු වූවන් එයින් මහත් සහනයක් ලබයි. අවබෝධයකින් යුතුව මෛත්‍රී සහගත පිරිසිදු චිත්ත සන්තායක් ඇතිකරගනිමින් මෙම සූත්‍ර දේශනාව සජ්ඣායනා කිරීම මහත් ඵල ලබා දෙන්නකි. සන්සුන් මනසකින් යුතුව එක් එක් රත්න භාවය පිළිබඳව අවබෝධයකින් යුතුව දිනපතා උදේ ගවස රතන සූත්‍රය සජ්ඣායනා කිරීම හෝ එයට සවන්දීම මඟින් දෛනික ජීවිතයේදීම විපුල ඵල නෙලාගත හැක. එහි වටිනාකම දිනෙන් දින ම අත් දැකිය හැකිය. එතුළින් ලද හැකි සහනය අපරිමිතය. හදවත් තුළ කරුණාව, දයාව, මෛත්‍රිය උපදවා ගෙන සන්සුන් මනසකින් යුතුව රතන සූත්‍රයේ එක් එක් ගාථාවන්ගේ අරුත් මෙනෙහි කරමින්, ඒවායේ ගැබ්ව ඇති රත්න භාවය ගිහි නුවණින් යුතුව අවබෝධ කරගනිමින් එම සත්‍ය බලයෙන් යහපතක් වේවා!යි අධිෂ්ඨාන පිහිටුවා ගන්නා ප්‍රඥාවන්තයින්ට ස්වකීය දෛනික ජීවිතය ඉතාමත් යහපත් ලෙස නිරෝගීව ගත කිරීමට අවශ්‍ය පසුබිම නිරතුරුවම සැකසෙයි.

'සත්‍යය' මතම පදනම් වූ මෙම සූත්‍ර දේශනාව ජනතාවගේ ලෞකික දියුණුව සඳහා මෙන්ම අධ්‍යාත්මික වශයෙන් ඔබ්බට යන ලෝකෝත්තර සැපයක් කරා ද මිනිසාගේ චිත්ත සන්තානය යොමු කරයි. ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨිකය. අකාලිකය. යහපත් දැක්මකින් යුතුව අප්‍රමාදීව වීර්යය වඩන්නේ නම් ලැබුවා වූ මිනිස් දිවියේ නිසි ඵල ලබමින් සුන්දර නිවන් මඟට පිවිසීමට අවස්ථාව උදාවනු ඇත. නැණ පමණින් අවබෝධ කරගැනීමට වෙර දරන්නෝ හැකි ඉක්මනින් ජීවිත ඉලක්ක සපුරා ගනිති

පෘථග්ජන මිනිසා දෛනික ජීවිතයේදී මුහුණ දෙන ගැටලු අපමණය එයින් ප්‍රධාන තැනක් ගන්නේ පවුල් පසුබිම දෙදරා යාමට තරම් බලපාන පස් පව්ය එයින් ද ප්‍රධාන වන්නේ පංචශීලයේ පෙන්වා දෙන පස්වන ශික්ෂාපදය සහ තුන්වන ශික්ෂාපදයත්ය මත් වතුරට ඇබ්බැහි වූ හා සල්ලාලකමට ගිජුව කාමමිථ්‍යාචාරයේ යෙදෙන ස්වාමිපුරුෂයෙක් සිටින පවුලක උද්ගතවන්නාවූ අවසනාවන්ත තත්වයන් හමුවේ අසරණ දරුවන් ස්වාමි දියණියන් පීඩා විඳින අවස්ථා එමටය. එයින් මිදීමේ අදහසින් තම ස්වාමියා යහමඟට

ගැනීමට වෙරදරන ස්වාමි දියණිය විවිධ ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වීම ස්වාභාවිකයි. ඇතැම් විට කාරුණිකව ද තවත් විටෙක නද පරුෂවද ස්වාමියාට කරුණු පහදා දෙන බිරිඳ තමා වෙත එල්ල වන වාග් ප්‍රහාර හමුවේ හෝ කායික ප්‍රහාර හමුවේ වඩාත් පීඩාවට ලක්වන අවස්ථා බොහෝය. මිතුරෙකුගේ මාර්ගයකින් හෝ යහ මඟට ගැනීමට වෙර දරන අවස්ථා ඇතත් මිතුරු වෙසින් ළඟාවන බොහෝ දෙනෙක් පවුලේ අභ්‍යන්තරික ගැටලු පිළිබඳව මනා අවබෝධයක් ලබා බොරදියේ මාළු බෑමට සූදානම් වන අවස්ථා ද නැත්තේ නොවේ.

ඊර්ෂ්‍යාවෙන් වෛරයෙන් ක්‍රෝධයෙන් ද්වේෂයෙන් යුතුව බිරිඳට පහරදෙන, තම බිරිඳ දරුවන් ඉදිරියේ පවා හෙළා දකින අකෘතඥ ස්වාමියෙකු ලැබුයේ වුවද මෙම භවය තමා පෙර කරන ලද කර්මයන්ට අනුරූපව සකස් වූවක් බව නුවණින් දැක මෙවන් ගැටලු වලට විසඳුම් සෙවිය යුත්තේ ධර්මය තුළින් ම බව අවබෝධ කටයුතුය. කරුණු පැහැදිලි කිරීමට යාමෙන්, මිත්‍ර ප්‍රතිරූපකයන් හට කියා පෑමෙන්, එකට එක කිරීමෙන් හෝ අන්ධබාලයින් මෙන් ගුප්ත ක්‍රියා මාර්ගයන්ට පිවිසීමෙන් සිදු වන්නේ ගැටලුව වඩාත් සංකීර්ණ වීම පමණි. ඉතාමත් සන්සුන් ව කරුණාව දයාව මෛත්‍රිය පෙරදැරි කරගෙන ත්‍රිවිධ රත්නයේ සරණයාමෙන් එහි සත්‍ය ගුණ බලය මෙනෙහි කර සත්‍ය ක්‍රියා කිරීමෙන් කෙනෙකු ළඟ ඇති දුර්ගුණ ඔහු විසින් ම අත්හරිනු දැකිය හැකිය. මෙය ඉතාමත් විශ්මය ජනක වූ සත්‍යයකි. යහපත් පවුල් පසුබිමක් ගොඩනගා ගැනීම සඳහා නිහඬව සන්සුන්ව අවතීර්ණ විය හැකි, අත්හදා බැලිය හැකි බලගතු ක්‍රමවේදයකි.

විසඳාගත නොහැකි දෛනික ගැටළු රාශියක් සත්‍ය ක්‍රියා කිරීමෙන් නිහඬවම විසඳා ගත හැකි අවස්ථා එමටය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වැනි උද්වේගතර හැඟීම් හමුවේදී ඒවා ක්ෂණිකව යටපත් කරගැනීමට හොඳම ඖෂධය තෙරුවන් ගුණ සිහි කිරීමයි. නොඑසේ නම් උදාවන තත්ත්වයන් හමුවේ අහිතකර ප්‍රතිඵල ලබා මුළු ජීවිත කාලයම බන්ධනාගාරයට හෝ කායික මානසික ආරෝග්‍ය ශාලාවකට සීමාවීමට ඇති ඉඩ කඩ බොහෝය. ඇතැම්විට අත පය පවා අහිමිව අබ්බගාතයකු ලෙසින් වටිනා ජීවිත රෝද පුටුවකට බිලි දී සුසුම් හෙළන අවස්ථා ද අපමණය. උසස් බුද්ධියක් ඇති මිනිසාගේ ඉරණම මෙලෙස වී නම් එය කෙතරම් ශෝචනීයද?

(8)

සත්‍යයේ බලය
Power of Truth

සාර්ථක ප්‍රතිඵල ලබා දෙන ලොව ශ්‍රේෂ්ඨතම වචනය "සත්‍යය" යි. එය ඉතාමත් නිර්මලය. පිවිතුරුය. යමක 'සත්‍යය' වූ කලී එකකි. එයට පරම, ඒකාන්ත වැනි විශේෂණ පද යෙදෙන්නේ ද එබැවිනි. සත්‍යය Absolute / Supreme වැනි විශේෂණ සමඟ ඉංග්‍රීසි භාෂාවේ යෙදෙයි. " Truth comes to the surface" යන ප්‍රස්ථා පිරුළට අනුව ද සත්‍යය යම් දිනක මතුපිටට පැමිණෙයි. එය වසන් කළ නොහැක. විශ්වයේ ඇති සියල්ල 'සත්‍යය' මත දෝලනය වෙයි. සත්‍යය යන්න මෙසේ ද වර්ගීකරණය වෙයි.

1. කවරෙකු හෝ විසින් පාරමී දම් පුරා, ප්‍රඥාව විකසිත වීමෙන් අත්දුටු දෙයක් (බුදු ගුණ)

2. විශ්වයේ පවත්නා ස්වාභාවික දෙයකි (ගඟ ගලයි/ඉර පායයි/කුරුල්ලන් පියාසර කරයි)

3. දැනුම සහ බුද්ධිය මෙහෙයවා යමෙක් පරීක්ෂණ, නිරීක්ෂණ ඔස්සේ හේතු සාධක සහිතව සපැමිණි නිගමනයක්

සත්‍ය වශයෙන්ම තමා විසින්ම අත් දුටු, තමා විසින්ම අවංක කැප වීමෙන් යුතුව සාක්ෂාත් කරගත්තා වූ කුසල කර්මයක් හෝ පරාර්ථ සේවයක් වේ නම් එය ඉස්මතු කර ගනිමින් එම සත්‍යයේ බලයෙන් අවශ්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට, පවතින බාධා අවම කර ගැනීමට, හෝ මැඩලීමට **සත්‍ය ක්‍රියා** (solemnly asseverate) කළ හැකියි. යහපත් ඵල ලැබීම සඳහා උපරිම විනාඩි ගණනක්, වාර ගණනක් "**සත්‍ය ක්‍රියා**" කිරීමට පුළුවන.

සත්‍ය ගුණයක් පාදක කර ගනිමින් මෙලෙස මනස තුළ ගොඩ නගා ගත හැකි අධ්‍යාත්මික ශක්තිය ඉතාමත් ප්‍රබලය. එම චිත්ත ශක්තිය ස්වාර්ථ හෝ පරාර්ථ සාධනය පිණිස යොදා ගත හැකිය. එනම් තමා කෙරෙහි මෙන්ම අනුන් කෙරෙහි වුවද යහපත් චේතනාවකින් යුතුව සත්‍ය ක්‍රියා කළ හැක.

According to the Dictionary of Pali Language " SACCAKIRIYA" ; "A recitation is made of acts done either in this or some former birth,and by the power of this merit, when the recitation is truthfully made , the effect intended to be produced takes place, however wonderful its character may be". If anyone solemnly asseverates it is very effective and the one who is in pain instantly recovers.

ජීවිත දහස් ගණනින් විනාශ කර දමමින් ඇඟිලි 999 ක් කපා මාලයක් මෙන් සකසා බෙල්ලේ එල්ලා ගෙන සිටි අංගුලිමාල. අවසන් ඇඟිල්ල සඳහා මෑණියන් වුවද හමු වුවහොත්, ජීවිතක්ෂයට පත්කිරීමට අදහස් කර සිටියද, රහත් වීමට පවා පෙර පින් තිබුණොත් බුදුරජාණන් වහන්සේ දක්නට ලැබිණි. ''නවතිනු මහණ නවතිනු''. යනුවෙන් කෑ ගසමින් බුදුරජාණන් වහන්සේ හඹා ගියද, බුදුගුණ බලයෙන් ඒ උත්සාහය ව්‍යාර්ථ විය. ''මා නැවතී සිටින්නෙමි, ඔබ නවතිනු''. හඬ ඇසෙනවාත් සමඟ ම ආයුධ බිම හෙලූ අංගුලිමාල බුදුන් සරණ ගොස් බවුන් වඩා රහත් බවට පත් වූ බව බෞද්ධ ඉතිහාසයේ සඳහන් වෙයි.,

අංගුලිමාල තෙරණුවන් දිනක් ගර්භනී මවක් දරු ප්‍රසූතිය සඳහා වේදනා විඳින හඬ අසා ඇයට පිහිට වීමට බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ඉල්ලා සිටි විට, ඇයගේ වේදනා පහව ගොස් ප්‍රසූතිය පහසු වීම සඳහා, සත්‍ය ක්‍රියාවක් කරන ලෙස බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ. ''තමා ආර්ය ජාතියෙහි උපන් දා පටන් සත්ව ඝාතනයක් කර නැති බව සත්‍යයි. ඒ සත්‍යයේ බලයෙන් වේදනාවට පත් ගර්භනී මවටත්, දරුගැබටත් සෙත් වේවා!'' යනුවෙන් සත්‍ය ක්‍රියා කිරීමෙන් අනතුරුව ඇගේ වේදනා පහව ගොස් දරු ප්‍රසූතිය පහසු වූ බව ද ධර්මයේ සඳහන්ය. එම සත්‍යක්‍රියාව කෙතරම් බල සම්පන්න වූයේ ද යන්න අද පවා භාවිතා කෙරෙන 'අංගුලිමාල පිරිත' තුළින් මනාව අත් දැකිය හැකිය. මෙම පිරිත බුදුරජාණනන් වහන්සේ විසින් අංගුලිමාල නම් වූ මහ රහතන් වහන්සේට උගන්වා වදාරන ලදී.

"අංගුලිමාල පිරිත"

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධොවනං
උදකම්පි විනාසෙති - සබ්බමෙව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධෙති තං ඛණෙ
ථෙරස්සංගුලිමාලස්ස - ලොක නාථෙන භාසිතං
කප්පට්ඨායී මහා තෙජං - පරිත්තං තං භණාමහෙ

(යතොහං භගිනි අරියාය ජාතියා ජාතො නාභි ජානමි
සංචිච්චපාණං ජීවිතා වොරොපෙතා,
තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති ///)

අංගුලිමාල පිරිත - සිංහල අරුත

සහෝදරිය, මම යම් විටක ආර්ය ජාතියේ උපන්නේවීද, පැවිදි උපසම්පදා ලැබීද, එතැන් සිට දැනුවත්ව ප්‍රාණියෙකුගේ දිවි තොර කළ බවක් නොදනිමි. ඒ සත්‍ය වචනයේ බලයෙන් ඔබට යහපතක්ම වේවා! දරු ගැබට සැපතක්ම වේවා! මෙම **උතුම් පිරිතෙන්,** හෙවත් සත්‍ය වදනින් සියලු රෝග සැනෙකින් දුරු වී නිරන්තර සුවයක් ශාන්තියක් වේවා !

බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි අවධියේ පමණක් නොව, අනන්ත අප්‍රමාණ සංසාරගත සත්වයින් අද පවා මෙම **අංගුලිමාල පිරිතෙන්** නිසි ඵල ලබාගන්නා බව ද අත් දැකිය හැකි සත්‍යයකි.

කෙතරම් සත්‍යවාදීව දිවි ගෙවන අයෙකුට පවා වුවද, ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මුල්වලින් වියරු වැටුන පෘතග්ජනයින්ගෙන් එල්ල වන අසත්‍ය චෝදනා, ඇනුම්, බැණුම් ගැරහුම් අනන්තය. ඒවා හමුවේ ඉන්ද්‍රකීලයක් සේ නොසෙල්වෙන මානසිකත්වයක් ගොඩ නගා ගන්නා ප්‍රඥාවන්තයෝ තම බුද්ධියට නිගා නොදී ඔවුන් කෙරෙහි මෛත්‍රිය පතුරවති. යහපත් අභිමතාර්ථ සාධනය පිණිස '**සත්‍ය ක්‍රියා**' කරති. අදෘශ්‍යමාන බලවේගයකින් මෙන් පැවති සියලු අහිතකර බලපෑම් සිඳී, බිඳී යන්නේ ද්වේෂ කරන්නවුන් මවිතයට පත් කරවමිනි.

විවාහ මංගල්‍යයකදී පෝරුව චාරිත්‍රයන්හිදී පවා වැදගත් තැනක් හිමිවන්නේ ජය මංගල ගාථාවලට ය. ජය මංගල ගාථා ද

සත්‍යය මත පදනම් වූ සෙත් පැතුමකි. සත්‍යය නම් සම්බුදු දහමයි. තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ගණනක් පෙරුම් දම් පුරා මීට වසර 2600 කට පමණ පෙරදී අවබෝධ කර ගත්තා වූ චතුරාර්ය සත්‍යය මේ දක්වා අසත්‍ය බවට තහවුරු කළ හැකි කිසිම විද්වතෙකු, ගාන්ධර්වයෙකු හෝ ගවේෂයෙකු තුන් ලොවෙහි කිසිම තැනක මේ දක්වා පහළ වී ඇති බවට කිසිදු සාක්ෂියක් නැත.

'සත්‍යය' මතම පදනම් වූ ජය මංගල ගාථා අටකින් නව යුවලට සෙත් පැතීම අනාදිමත් කාලයක සිට පැවත එන්නකි. විවාහයේ සාර්ථකත්වය, ස්ථිරසාරත්වය මත ජන සමාජයක් සුමඟට යොමු වනවා පමණක් නොව එවන් සෙත් පැතුමකින් ලැබෙන්නා වූ ආශිර්වාදය ඉදිරි පරම්පරා සිය දහස් ගණනකට යහපත උදා කරයි. විවාහයක මුඛ්‍ය පරමාර්ථය වනුයේ රට, ජාතිය, ආගමට හිතැති, එමෙන්ම එය සුරැකීමට තරම් ධීර වීර බලපරාක්‍රමයෙන් යුත් දරු පරපුරක් සමාජයට දායාද කිරීමයි. ශාසනයේ චිරස්ථිතිය පිණිස එක් දරුවකු හෝ සසුන්ගත කිරීමට මවකට හා පියෙකුට සිත් පහළවන්නේ නම් එය සතර වර්ගයටම නිවන් දැකිය හැකි මහානුබල සම්පන්න පුණ්‍ය කර්මයක් බව ධර්මයේ සඳහන්ය. මෙම සියල්ලටම අඩිතාලම වන විවාහය, දෙදරායාමට නොදී ශක්තිමත් ලෙසට පවත්වාගැනීමටත්, භෞතික මෙන්ම මානසික හා අධ්‍යාත්මික ශක්තියෙන් අනූණ පින්වත් දරු සම්පත් ලැබීමටත්, මහත් සේ ඉවහල් වන බැවින් ජීවිතයේ එම සුවිශේෂී අවස්ථාවට බුද්ධානුභාවයෙන් ආශිර්වාද ලබාදීම චිරාගත සම්ප්‍රදායක් බවට පත්ව ඇත. වත්මන් සමාජයේ බොහෝ දෙනෙකුට මෙම ජය මංගල ගාථාවන් සියල්ල කටපාඩමින් සජ්ඣායනා කළ හැකි වුවද, අර්ථය දෙස විමර්ශනාත්මකව බලා බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් ඒ ජයග්‍රාහී අභියෝග පිළිබඳව අවබෝධඥානය වර්ධනය කරගන්නේ නම්, එය කාලීනව මහත් ඵලදායී වනු ඇත. එදා බුදුරජාණන් වහන්සේ සත්‍ය වශයෙන්ම මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය කෙතරම් තේජවන්තද කිවහොත් එම තෙල බලය නව යුවලකට ආශිර්වාද ගෙන ඒමට තරම් ප්‍රබලය. අනාදිමත් කාලයක සිට සම්ප්‍රදායානුකූල චාරිත්‍රයක් ලෙසින් පැවත එන මෙම ජයමංගල ගාථාවන්හි අන්තර්ගත සත්‍යය පිළිබඳව පාලි, ඉංග්‍රීසි, සිංහල කුමන හෝ භාෂාවකින් පැහැදිලිව අවබෝධ කටයුතුමය

ජය මංගල ගාථා -
(The Verses of the Buddha's Auspicious Victories)

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරි මේඛලං උදිත ඝෝර සසේන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

අවි සහිත අත් දහසක් මවාගෙන, ගිරි මේඛලා නම් ඇතු පිට නැගී බිහිසුණු මරසෙන් පිරිවරා ආ (වසවත්) මරු, මුනීන්ද්‍රයාණන් වහන්සේ, දානාදි දම් බෙලෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Bahum sahassam-abhinimmita-savudhantam
Grimekhalam udita-ghora-sasena-maram
Danadi-dhamma-vidhina jitava munindo
Tan-tejasa bhavatu te jaya-mangalani

Creating a form with 1,000 arms, each equipped with a weapon, Mara, on the elephant Girimekhala, uttered a frightening roar together with his troops. The Buddha defeated him by means of such qualities as generosity:
By the power of this, may you have the greatest victory

2. මාරාතිරේක මභියුජ්ඣිත සබ්බ රත්තිං
ඝෝරම්පනාලවක මක්ඛමථද්ධ යක්ඛං
ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

තවත් මරුවකු මෙන් මුළු රැයක් සටන් කළ නපුරු ගුණමකු දැඩි ආලවක යකු මුනීන්ද්‍රයාණන් වහන්සේ, ඉවසීමේ බෙලෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Maratirekam-abhiyujjhita-sabba-rattim
Ghorampan'alavaka-makkham-athaddha-yakkham
Khanti-sudanta-vidhina jitava munindo

Tan -tejasa bhavatu te jaya-mangalani.

Even more frightful than Mara ; the obstinate demon Alavaka battled with the Buddha throughout the night. The Buddha defeated him by means of his patience.
By the grace of this, may you have joyous victory

3. නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
දාවග්ගි චක්ක මසනීව සුදාරුණන්තං
මෙත්තම්බුසේක විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

නාලාගිරි නම් ඇත් රජු අධික ලෙස බීමත්ව ඉතා දරුණු ලැව් ගින්නක් මෙන්ද, හෙණ සැරයක් මෙන්ද ඉදිරියට පැමිණීමේදී, මුනින්ද්‍රයාණන් වහන්සේ, මෛත් දිය ඉසීමේ බලයෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Nalagirim gaja-varam atimattabhutam
Davaggi-cakkam-asaniva sudarunantam
Mett'ambuseka-vidhina jitava munindo
Tan-tejasa bhavatu te jaya-mangalani.

Nalagiri, the king elephant: ferocious beast highly intoxicated, was raging like a forest fire and was terrible as a thunderbolt. The Buddha subdued him by Sprinkling the water of good will.
By the power of this, may you have joyous victory

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදා රුණන්තං
ධාවං තියෝ ජනපථං ගුලිමාල වන්තං
ඉද්ධීභිසංඛතමනෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

කඩුපත අමෝරාගෙන, තුන් යොදුන් මඟ ලුහු බැඳ දිව ආ අංගුලිමාල නම් වූ මිනි මරුවා මුනීන්ද්‍රයාණන් වහන්සේ, ඍද්ධිමය බලයෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා !

Ukkhitta-khaggam-atihattha sudarunantam
Dhavan-ti-yojana-path'anguli-malavantam
Iddhibhisankhata-mano jitava munindo
Tan-tejasa bhavatu te jaya-mangalani.

With lifted sword, for a distance of three leagues wicked murder Angulimala followed. The Buddha subdued him by his supernatural powers **By the grace of this, may you have joyous victory**

5. කත්වාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ
සන්තේන සෝම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජය මංගලානි

ගැබිණියක මෙන් දර උදරයක් තනාගෙන පැමිණ ජන සමූහයා මැද දුෂ්ඨ වචන ප්‍රකාශ කළ චිංචි මානවිකාව මුණීන්ද්‍රයාණන් වහන්සේ, සන්සුන් සෞම්‍ය ගුණයෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Katvana kattham-udaram iva gabbhiniya
Ciñcaya duttha-vacanam jana-kaya-majjhe
Santena soma-vidhina jitava munindo
Tan-tejasa bhavatu te jaya-mangalani

Having made a wooden belly to appear pregnant, Ciñca made a rude accusation in the midst of the gathering The Buddha defeated her by his serene and graceful bearing.

By the grace of this, may you have joyous victory

6. සච්චං විහාය මති සච්චක වාද කේතුං
වාදාභිරෝපිත මනං අති අන්ධ භූතං
පඤ්ඤාපදීප ජලිතෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානී

වාදයෙහි ඇලුණු සිතින් අන්ධ වූ සච්චක තෙමේ සත්‍යය

අතහැර දමා වාදයට පැමිණි විට මුනීන්ද්‍රයාණන් වහන්සේ, නැණ පහන් දැල්වීමෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Saccam vihaya mati-saccaka-vada-ketum
Vadabhiropita-manam ati-andhabhutam
Pañña-padipa-jalito jitava munindo
Tan-tejasa-bhavatute/jaya-mangalani.

Haughty Saccaka, who ignored truth, was like a banner of controversy, and his vision was blinded by his own disputations. The Buddha defeated him Lighting the lamp of wisdom **By the grace of this, may you have joyous victory**

7. නන්දෝපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තේන ථේර භුජගේන දමාපයන්තෝ
ඉද්ධූපදේස විධිනා ජිතවා මුනීන්දෝ
තං තේජසා භවතු තේ ජය මංගලානි

නැණවත්, ඍද්ධිමත් නන්දෝපනන්ද නම් නාගයා මුනීන්ද්‍රයාණන් වහන්සේ, ඍද්ධිය පිළිබඳ උපදෙස් ලබා දී මුගලන් මහ රහතන් වහන්සේ ලවා දමනය කළ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Nandopananda-bhujagam vibudham mahiddhim
Puttena thera-bhujagena damapayanto
Iddhupadesa-vidhina jitava munindo
Tan-tejasa bhavatu te jaya-mangalani.

The wise and powerful serpent Nandopananda was a serpent with-great/power-but..wrong..views. The Buddha defeated him by psychic power through his disciple son – Thera Moggallana. **By the grace of this, may you have joyous victory**

8. දුග්ගාහ දිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුති මිද්ධි බකාභිධානං
ඤාණාගදේන විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානී

වැරදි මත නමැති සර්පයා විසින් දෂ්ඨ කරන ලද (වැරදි විශ්වාසයන්හි තදින් එල්බ සිටි) බක නම් වූ බඹු මුණීන්ද්‍රයාණන් වහන්සේ, නැණ පහන දැල්වීමෙන් දිනූ සේක. එම තේජානුභාවයෙන් ඔබට ජය මංගල්‍යයක් ම වේවා!

Duggaha-ditthi-bhujagena sudattha-hattham
Brahmam visuddhi-jutim-iddhi-bakabhidhanam
Ňanagadena vidhina jitava munindo
Tan-tejasa/bhavatu/te/jaya-mangalani.

His hands bound tight by the serpent of wrongly held views, Baka, the Brahma, thought himself pure in his radiance and power. The Buddha cured him cure with His Medicine of wisdom. **By the grace of this, may you have joyous victory.**

9. ඒතාපි බුද්ධ ජයමංගල අට්ඨ ගාථා
යෝ වාචකෝ දින දිනේ සරතේමතන්දි
හිත්වානනේක විවිධානි චූපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරෝ සපඤ්ඤෝ

යමෙක් මෙම බුදු ගුණ ඇතුළත් ජයමංගල ගාථා 8 දිනපතා සජ්ඣායනා කරමින්, නිතර නිතර සිහි කරන්නේ ද, ඒ නැණවත් තැනැත්තා අනේක වූ විවිධ උවදුරු වලින් මිදී **මොක් සුවය (නිවන)** පසක් කරගනී.

Etapi buddha-jaya-mangala-attha-gatha
Yo vacano dinadine sarate matandi
Hitvan'aneka-vividhani c'upaddavani
Mokkham sukham adhigameyya naro sapañño.

The wise one, who daily recites and earnestly remembers these eight verses of joyous victory of the Buddha, will get rid of various misfortunes and **gain the bliss of Nibbana.**

ෆ.. සතර වර්ගයම නිවන් දක්නට ඕන නැත තව පිංකමක්.....

රෝග පීඩාවලින් සැනසුම - ලබන්නට හැක බුදු ගුණෙන්
දැවෙන හදවත් නිවාලන්නේ - නිවී සැනසෙන දම් ගුණෙන්
සෙත් පිරිත්වල දෝංකාරය - විසිර යන්නේ සඟ ගුණෙන්
ලබන්නට බැරි දෙයක් ලොව නැත - තුණුරුවන්ගේ ගුණ බලෙන්

අපේ සම්බුදු පියා දෙසූ දම් - ගඟක් දස අත ගලා යනවා
ලැබේ සැමහට සිසිල් පහසක් - හදේ ගිනි දැල් නිවී යනවා
නවත් කල් දම් ගඟ ගලන්නට - සංඝ පරපුර සවිය දෙනවා
මමත් සඟ පරපුරට පුරුකක් - වන්න පැතුමත් පතා එනවා

භවය ජයගත් අයෙක් වේ නම් - සියලු දෙය සසුනට පුදාවී
ජවය ගෙන භව ගමන නවතා - උතුම් නිවනට ළඟා වේවී
බලය දැන බුදු ගුණම සිහිකොට - දරුවනුත් සසුනට පුදාවී
කුසින් බිහිකළ දරුවෝ පුරනා - පාරමී දැක සතුටු වේවී

සසර ගමනේ දුකම දැක දැක - නවත් මේ කොයිබද ? දුවන්නේ
එතෙර වන්නට සසර සයුරෙන් - වහා පින් - දම් සිදු කරන්නේ
නිතර නිතරම සවන් දී බණ - දහම් දිවියට ගලප ගන්නේ
සතර වර්ගෙම නිවන් දකිනට - දරුවනුත් සසුනට පුදන්නේ

උතුම් සසුනට පුද කරන්නට -පුතෙකු පින්වත් ඉපදුණේ නම්
නිවන් දක්නට සතර වර්ගෙම -එය ම ඇත පින පෑදුණේ නම්
පුරන්නට පිළිවෙත් පෙළක් ඇත -එයට පෙර පින මතු වුනේ නම්
බලන් ඉන්නට එපා තව කල් - **අප්පමාදෝ අමත පදං**

චිත්ත බලයයි සෑම බලයම - අභිබවා ඉදිරියට එන්නේ
යුක්ති සහගත නොවන දෙය - හමුවේදී මිහිකත කම්පාවන්නේ
ශක්ති පමණින් ඵල ලබන්නයි - දහම ලොව විවරව තිබෙන්නේ
භක්තියට අනුවමයි 'සත්‍යය' - මිනිස් හදකට කා වදින්නේ

උතුම් සඟ පරපුරට පුරුකක් -එක් කරන්නට වෙර ගනිත්වා!
විකුම් බලයෙන් සසුන රැකගෙන -දහම් ගඟ දිගටම ගලත්වා!
පැතුම් ඉටු වී සැනසුමෙන් දිවි -මගම ඒකාලෝක වෙත්වා!
සිතුම් සඵලව ලොවේ සැමටම -නැවුම් යුගයක් උදා වෙත්වා!

(10)
සතර අවිජහිත ස්ථාන වන්දනා ගාථා

සැදැහැති කුල පුතෙකුට දැකීමට සුදුසු වූ, සංවේග කටයුතු ස්ථාන 4 කුමක්දැයි බුදුපියාණන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේ දී ආනන්ද හිමියන්ට වදාළ සේක.


ලුම්බිනි
මායා සුතො සුගත සාකිය සීහ නාථො
ජාතක්ඛණෙ සපදසා මහි වංකමිත්වා
යස්මිං උදීරයිගිරං වර ලුම්බිනිම්හි
තං ජාත චෙතිය මහං සිරසා නමාමි

බුද්ධගයාව
යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනෙන
ජෙත්වා සවාසන කිලෙස බලං මුනින්දො
සම්බොධි ඤාණමධිගම්ම විභාසි සම්මා
තං බොධි චෙතියමහං සිරසා නමාමි

ධම්මික චෛත්‍යය (ඉසිපතනය)
සංකම්පයං දස සහස්සිය ලොක ධාතුං
දෙසෙසි සත්‍ථා සුගතො වර ධම්ම චක්කං
බාරාණසී පුර සමීප වනෙ මිගානං
තං ධම්ම චෙතිය මහං සිරසා නමාමි

පරිනිබ්බාන චෛත්‍යය
කත්වාන ලොක හිත මත්ත හිතඤ්ච නාථො
ආසීති කොටි උපවත්තන සාල නම්හි
යස්මිං නිසජ්ජ සයනො නිරුපාධිසෙසං
නිබ්බාන චෙතිය මහං සිරසා නමාමි.

මහා පරිනිබ්බාන සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කර ඇති මෙම හතර අවිජහිත ස්ථාන, වන්දනා කිරීම සඳහා වන ශ්‍රේෂ්ඨ ගාථා රත්නයන් 4 ධර්ම දානයක් සේ සැදැහැවතුන් අතට පත් කිරීමේ අදහස මා සිත තුළ පහළවන්නට වූයේ තෙවරක් දඹදිව ශුද්ධ භූමිය වන්දනා කර ගැනීමෙන් අනතුරුවය. 1981දී දඹදිව ශුද්ධ භූමිය වන්දනා කර ගත් අපගේ දයාබර පියතුමාණන් විසින්, සිය අත්අකුරින්ම ලියා තබනු ලැබූ මෙම ගාථා 2014 දී නොසිතූ අයුරින් මා අතට පත්වීම මසිත තුළ පහන් සංවේගය ඉපදවීමට හේතු විය. එය එලෙසින්ම සකසා ධර්ම දානයක් සේ බෙදා හරිමි. පඤ්චශීලය තම ජීවිතයට ආභරණයක් සේ සුරකිමින් පුරා වසර 85 ක් ආයු වළඳා 2005 ජූලි මස 19 වන දින දිවියෙන් සමුගත් අපගේ දයාබර පියාණන් වූ විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට මෙම ධර්ම දානය තුළින් රැස්කරගන්නා වූ සියලුම පින් උතුම් නිවන පිණිසම හේතු.වේවා!යි පතමි.

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක
(2016 ජූලි මස 19 වන දින - 2 වන මුද්‍රණය)

සතර අවිජහිත ස්ථාන, වන්දනා ගාථා රත්නයන් 4 හි සිංහල අරුත්.

ලුම්බිනී වන්දනා ගාථා

මාගේ ශාක්‍යසිංහ වූ බුදුපියාණන් වහන්සේ , සිදුහත් නමින් මහාමායා දේවියගේ කුසයෙන් මෙලොවට බිහිව, මිහිතලය සසලව පැනනැගුණු සත් පියුම් මත එකින් එකට පා තැබූ ඒ පූජනීය ස්ථානයේ; ලුම්බිණි සල් උයනේ පිහිටි ජාත චෛතිය මම සිරස නමා වදිමි.

මහාමායා දේවිගේ කුස තුළින් බිහිවූ කුමරු සිදුහත්
වහා පා පිළිගන්න මිහිකත තුලින් මතු වූ නැවුම් සියපත්
තබා ඒ මත එකින් එක ඉදිරියට නැගූ පියවර සතක්
නමා හිස මම වදිමි චෛතිය පිහිටි ඒ ලුම්බි නිය හගවත්

බුද්ධගයාව -ජය ශ්‍රී මහාබෝධි වන්දනා ගාථා

අපගේ බුදු පියාණන් වහන්සේ , සියලු කෙලෙස් නසා ඒ උතුම් ලොව්තුරු බුද්ධත්වයට පත්වූයේ මෙ වජ්‍රාසනය මත වැඩ හිඳිමිනි. ඒ වජ්‍රාසනය පිහිටි ජය ශ්‍රී මහා බෝධි චෛතිය මම සිරස නමා වදිමි.

සපුරා උතුම් දස පාරමී බෝසතාණන්
දස බිම්බරක් මරසෙන් පරදා හැරීමෙන්
විදුරාසනෝවැඩහිඳ බුදුබව ලබද්දී
සිහිලැල් සෙවණ සැලසූ බෝ හිමි වදිමි මම

ඉසිපතන මිගදාය - ධම්මික චෛත්‍ය වන්දනා ගාථා

අපගේ බුදුපියාණන් වහන්සේ දස දහසක් ලෝක ධාතුන් කම්පාවට පත් කොට උතුම් වූ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ බරණැස ඉසිපතන මිගදායෙහි පිහිටි ධම්ම රාජික චෛත්‍ය රාජයාණන්ට මම සිරස නමා වදිමි.

දස දහස් සක් ලෝක ධාතුව කම්පිතව ලද නෙක් පිදුම්
මධුර දම් සක් සුතුර පළමුව දෙසූ සේක සිරි සම් බුදුන්
සොඳුරු බරණැස ඉසිපතන මිග දායෙ ධම්මික සෑ රදුන්
මම වඳින්නෙමි සැදැහැ බැතිසිත පෙරටු කොට දී අත් මුදුන්

කුසිනාරා පිරිනිවන් මඤ්චකය වන්දනා ගාථා

සියලු ලෝක සත්වයන්ට හිතවත් වූ මාගේ බුදුපියාණන් වහන්සේ අසූ වසක් ආයු වළඳා අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ ස්ථානයේ පිහිටි උපවත්තන සල් උයනේ පිහිටි පිරිනිවන් චෛත්‍ය රාජයාණන්ට මම සිරස නමා වදිමි..

හැම සත චෙතට සෙත සලසා නිවන් මගේ
පන්සාළිස් වසක් කිස නිම කළද අගේ
පිරිනිවනින් නිවුන සම්බුදු රජුන් මගේ
වඳිනට පිරිනිවන් සෑ රජ දොහොත් නැගේ

රත්නමාලී ගාථාත්‍රය

රත්නත්‍රයේ අනන්ත මහා ගුණ ස්කන්ධය පිරිසිදු හදවතකින් ශ්‍රද්ධා සම්පන්නව සිහිපත් කිරීම පවා මහත් වූ සැනසීමකි. රත්නමාලී බන්ධන ගාථා යනු එම ගුණ බලය අවිච්ඡින්නව එකිනෙකට බැඳී පවතින සේ නිසිලෙස අක්ෂර යොදමින් සකස් කරනු ලැබූ මහා බල සම්පන්න ගාථාත්‍රයකි. සියලු කරදර අපල උපද්‍රවයන්ගෙන් නොසිතූ විරූ සහන ලබා ගනිමින් දිවි මග සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරන සැමට මෙය දෛනිකව හැකි උපරිම වාර ගණනක් සජ්ඣායනා කිරීමෙන් එම අරමුණු සාක්ෂාත් කරගත හැක. **2600 සම්බුද්ධ ජයන්තිය** ලොව පුරා බැතිමතුන් පිළිවෙතින් පෙළගැසෙමින් සමරන මේ මොහොතේ ශ්‍රද්ධා සම්පන්නව මෙම ගාථාත්‍රය භාවිතා කරමින් මෙහි යථාර්ථය අත්දැකීමට **''මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම''** ඔබට ආරාධනය කරයි.

සම්පත් උදාකරන
රත්නමාලී යන්ත්‍ර රාජයා

රත්නමාලී ගාථාත්‍රය

සං සාර සාරොස විනීත නීසං
සං නීත සාතං සුවිසාර ධීසං
සං ධීර කං සොණ්ණ තනු පලාසං
සං ලාප දේසිං පණමෙ හිසාසං

සං සාහි ගං කේවල මොහ නාසං
සං නාහ කං මාර රණෙ විසේසං
සං සේවිතං දාසි මුදාර භාසං
සං භාර ධම්මං පණමෙ සදාසං

සං දාස ගං නා සිත පාප නාසං
සං නාප ධං සිං හතඝොර පාසං
සං පාර ගාමිං සුවිසාර වාසං
සං වාර සංඝං පණමෙ රසාසං

මෙම මහානුභාව සම්පන්න ගාථාත්‍රයේ අර්ථය පහසු භාෂාවකින් (සිංහල හෝ ඉංග්‍රීසි) අවබෝධ කටයුතුය. ඒ සඳහා සරල අර්ථ දැක්වීමක් පසුපිටෙහි ඉදිරිපත් කෙරේ. එහෙත් මෙම ගාථාත්‍රය දේශනා කරනු ලැබූ ආකාරයෙන් ම උච්චාරණය කර එහි ගතානුගතික භාවය මෙන්ම බෞද්ධ සංස්කෘතිය ද රැක ගැනීම අපගේ යුතුකම බවද අමතක නොකළ යුතුය.

භවෙන් භවේ පෙරුම් පුරා - ලෝ සත දුක් සුසුම් නිවූ
ඒ භගවත් මුනි ගෞතම - නමදිමු ගුණ අනන්ත වූ

I forfeit my homage to the virtuous Load Buddha who quenched the sorrows of all beings (Terrestrial or Celestial) (human and inhuman / worldly & outer space) by Practicing 10 virtues in the Sansara (in the circle of Birth & Death)

අවිදු අඳුර බිඳ හැරලා - සඟ මොක් සුව සෙත සෑදූ
හිමි දෙසූ සදහම් තෙවලා - මම නමදින්නෙමි සාධූ

I pay my homage to Dhamma of the Load Buddha which made us to see the eternal bliss, by breaking off the screen of darkness.

සසර කතර තරණය කර - එතෙර දකින මඟ පෑදූ
බහුජන හිත ගුණ ප්‍රමුදිත - වඳිනෙමි සඟ ගණ සාධූ

I venerate Maha Sanga who practice moral virtues & walk along the middle passage way being a field of merits to all humans.

☸ ☸ ☸

ප්‍රාර්ථනා

ඉමිනා පුඤ්ඤ කම්මේන - මාමේ බාල සමාගමො
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා

By means of these meritorious deeds;
May I never join with the foolish,
May I always join with the wise,
Until the time I attain Nibbana.

සිදු කරගනු ලැබූ මෙම පුණ්‍ය කර්මයේ බලයෙන්, නිවන් දක්නා තෙක් අසත්පුරුෂ ඇසුරක් නොවී සත්පුරුෂ සේවනයක්ම වේවා!!!

- මෙම ධර්ම දානමය කුසලකර්මයේ බලයෙන් ගෞතම බුද්ධ ශාසනය තුලදීම විශ්වයේ ඇති සියලු තතු යථා පරිද්දෙන් දැකීමට පාඨක ඔබ-අප සැමගේ බුද්ධිමය නෙත් විවර වේවා
- යා යුතු මග හෙළිකර ගැනීම සඳහා ශ්‍රද්ධා ශක්තිය පහළ වේවා !
- පරීක්ෂණ හා නිරීක්ෂණයන් තුළින් නිවැරදි නිගමනයන්ට අවතීර්ණ වීම සඳහා වූ පුළුල් දැනුම ලබා ගැනීමට විද්‍යාව පෑදේවා !
- අවධාරණය කරගනු ලබන යථාර්ථවාදී දැනුම් සම්භාරය තුළින් ප්‍රඥාව පහළ වේවා !
- අවසානයේදී ප්‍රඥාවෙන් අගතැන්පත්ව දස අත විහිදී යන්නා වූ ප්‍රඥා කිරණ මගින් උතුරායන ආලෝක ධාරාවන් හමුවේ ජාතියක්, ජරාවක් දුකක් නැති අති සුන්දරවූත්, පරම රමණීය වූත් නිර්වාණ ධර්මයම ප්‍රත්‍යක්ෂ වේවා !!!

පුණ්‍යානුමෝදනාව

සදහම් රුචි යහගුණ කැමති සමාජයකට පිළිගැන්වීම සඳහා සකස් කරන ලද මෙම සදහම් ග්‍රන්ථය, 2016 ජූලි මස 19 වන දිනට යෙදී ඇති අප දයාබර පියාණන් වූ **විශ්‍රාමලත් විදුහල්පති, විජයසේන කිරිවත්තුඩුව** මැතිතුමාගේ 11 වන ගුණානුස්මරණ පිංකම වෙනුවෙනි.

සම්පාදනය කර මුද්‍රණය කරවා සිදුකරනු ලබන මෙම ධර්මදානයේ කුසලානිසංස එතුමාටත්, සෙනෙහබර මෑණියන් වූ **විශ්‍රාමලත් විදුහල්පතිනි ලෝරා හෙට්ටිආරච්චි** මැතිනියටත්, දෙපාර්ශවයේ මියගිය අනිකුත් සියලුම ඥාති මිත්‍රාදීන්ටත් නිර්වාණ සුවය සාක්ෂාත් කරගැනීමට හේතු වේවා !

එමෙන්ම මෙම ග්‍රන්ථය ද මුද්‍රණය සඳහා පොළඹවමින් සෝදු පත් බැලීමට සහාය දක්වමින්, 2016 ජූලි මස 19 වන පුර පසළොස්වක දිනට යෙදෙන, වස් ආරාධනා පිංකමේදීම සැදැහැතියන් වෙත පරිත්‍යාග කිරීම සඳහා මුද්‍රණ කටයුතු ද කාර්යක්‍ෂමව සිදු කර ගැනීමට අප්‍රමාදීව වෙහෙස වූ අප කල්‍යාණ මිත්‍ර සුනේත්‍රා හෙට්ටිආරච්චි විශ්‍රාමලත් ගුරු මෑණියන්ගේ නමින් මිය පරලොව ගිය එතුමියගේ දයාබර දෙමාපියන් වූ විශ්‍රාමලත් විදුහල්පති **ජේ. වෙල්ලප්පුලි** මැතිතුමාට සහ විශ්‍රාමලත් පාඨශාලාචාරිණී **එම්. විතානවසම්** මැතිනියටත් දයාබර ස්වාමිපුරුෂයාණන් වූ පාඨශාලාචාර්ය **ජී. එල්. හෙට්ටිආරච්චි** මහතාටත් නිවන් සුව සාක්‍ෂාත් කරගැනීම සඳහා මේ පිං හේතු වේවා !

සාධු ! සාධු !! සාධු !!!

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

ආශ්‍රිත ග්‍රන්ථ

- පිරුවානා පොත් වහන්සේ
- තුන් සූත්‍ර දේශනා - අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම ස්ථවිර
- රතන සූත්‍ර වර්ණනාව - ආනන්ද එන්. තිලකරත්න
- බෞද්ධ ඇදහිල්ල - අත්තුඩාවේ ශ්‍රී රාහුල හිමි
- ධම්ම පදය
- චතුරාර්ය සත්‍යය - රේරුකානේ චන්දවිමල මහා නාහිමි
- ශබ්දාර්ථ රත්නාකරය - බේරගමුවේ ශ්‍රී රේවත හිමි
- බෞද්ධ පරමාදර්ශයන් - බුද්ධංගල ආනන්ද හිමි
- දිවි මගට දහම් මග - තලගල සුමනරතන හිමි
- Education for Mindfulness – Ven: Dr Mirisse Dhammika
- Dictionary of the Pali Language – Robert Ceasar Childers

සටහන්

සටහන්

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

බුද්ධ, ධම්ම, සංඝ -රත්නයන් බවට පත්වන්නේ කෙසේද?
How do The Buddha, Dhamma and Sangha become jewels?

බුදු ගුණ කිසිවකට සම කළ නොහැක්කේ ඇයි?
Why is it unable to compare the great qualities of Buddha

උතුම් ත්‍රිවිධ රත්නයේ බලය කෙබඳු ද?
How is the power of the Noble Triple Gem?

දෛනික ජීවිතයේ දී රතන සූත්‍රයේ උපරිම ඵල ලබන්නේ කෙසේ ද?
How to get the best use of Jewel Discourse in day to day life ?

රතන සූත්‍රය සජ්ඣායනා කිරීමෙන් හෝ එයට සවන් දීමෙන් ලද හැකි ඵලය කෙතරම් සහනදායී ද?
How pleasant is the result of chanting or listening the Jewel Discourse?

පරම සත්‍යය මත පදනම් වූ සත්‍යක්‍රියාව කෙතරම් බලගතු ද?
How powerful the asseveration which depends on noble truth?

ධර්මානුකූල පිළිතුරු, ගද්‍ය සහ පද්‍ය වශයෙන් භාෂා 3 කින් අන්තර්ගතයි.

Answers according to Dhamma are included in Pali, English and Sinhala in prose & verses

---

**මෙම ග්‍රන්ථයෙහි පාලි ගාථාවන්හි ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන්,
මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා,
කොළඹ 7 ඩී.එස්.සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාමලත්
ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්ණී කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිනිය විසිනි.**

ISBN 978-955-50082-6-6